

# මිදි වගාව

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයකි

ලෝකයේ බහුලව වගා කරනු ලබන මිදි විශේෂය විටිස් විනිෆෙරායි. එය කැස්පියන් හා කළු මුහුද අවට ප්‍රදේශයෙහි සම්භවය වී ඇතැයි සැලකේ. මෙයට අමතරව උතුරු ඇමරිකානු සම්භවයක් ඇතැයි සැලකෙන විටිස් ලැබ්‍රස්කා විශේෂය වගාවක් වශයෙන් විනිෆෙරා තරම් ජනප්‍රිය නැත.

අළුත් පළතුරක් ලෙස ආහාරයට ගැනීමට, වයින් නිෂ්පාදනය හා වියළි මිදි නිෂ්පාදනය යන ප්‍රධාන ප්‍රයෝජන තුන සඳහා මිදි වගා කරනු ලැබේ.

1990 වසරේදී ලෝකයේ මුළු මිදි නිෂ්පාදනයෙන් 71% ක් වයින් සඳහා ද 27% අළුත් පළතුරක් ලෙසද 2% ක් වියළි මිදි සඳහා ද යොදගෙන තිබේ. මේ අනුව වගා කරනු ලබන මිදි වර්ගද වෙනස් වේ. මෙයට අමතරව යුෂ ලබාගැනීම, ටින් කිරීම වැනි කාර්යයන් සඳහාද මිදි අස්වැන්න භාවිතා කළ හැකිය.

1995 වසරේදී අළුත් පළතුරක් වශයෙන් මිදි මෙට්‍රික් ටොන් 850 ක් හා වියළි මිදි වශයෙන් මෙට්‍රික් ටොන් 1412 ක් මෙරටට ආනයනය කර ඇත. ඒ සඳහා රුපියල් මිලියන 100 ක් පමණ වැය වී තිබේ. 1999 වසරේදී මෙට්‍රික් ටොන් 1815 ක පමණ මිදි ප්‍රමාණයක් පළතුරක් ලෙසද වියළි මිදි වශයෙන් මෙට්‍රික් ටොන් 1685 ක් පමණද ආනයනය කර ඇත. මේ සඳහා වැයවී ඇති මුදල රුපියල් මිලියන 225 ක් පමණ වේ.

සාර්ථකව මිදි වගා කිරීම සඳහා විශේෂ පුහුණුවක් තිබිය යුතුය. විශේෂයෙන් කප්පාදු කිරීම හා පුහුණු කිරීම වැනි ඉතා වැදගත් වගා පාලන ක්‍රම නිසි පරිදි ඉටු නොකිරීම නිසා අස්වැන්න බෙහෙවින් අඩු විය හැකිය. එසේම වගාව කෙරෙහි අඛණ්ඩව අවධානය යොමු කිරීමද ඉතා වැදගත්ය.

වෙනත් බොහෝ පළතුරු වගාවන් සමග සසඳන කළ මිදි වගාව සඳහා වැඩි මූලික ප්‍රාග්ධනයක් යෙදවිය යුතුය. නමුත් ක්‍රමවත්ව නඩත්තු කළ මිදි වගාවකින් විශාල ආදායමක් ලබා ගත හැකිය. ශ්‍රී ලංකාවේ වගා කළ හැකි වෙනත් සියළුම පළතුරු වලට වඩා වැඩි ආර්ථික ප්‍රතිලාභයක් ලබාදීමට මිදි වගාව සමත්ය. එනිසා සාර්ථකව මිදි වගා කළ හැකි ප්‍රදේශවල සෙසු පළතුරු වගී අභිබවා ඉදිරියෙන් සිටීමට එයට හැකියාවක් ඇත. දේශීයව පවතින අධික ඉල්ලුම සහ වැඩි මිලකට අලෙවි කර ගත හැකිවීම නිසා මිදි වගාව ගොවීන් අතර ක්‍රම ක්‍රමයෙන් ජනප්‍රියවීමට හේතු වී තිබේ.

## දේශගුණික අවශ්‍යතා

වාණිජ මට්ටමින් වගා කිරීම සඳහාත්, අස්වැන්නේ ගුණාත්මය වැඩිකරගත හැකිවීම නිසාත්, මිදි වගා කිරීම සඳහා ඉතාම සුදුසු වන්නේ අප රටේ වියළි කළාපයයි. නමුත් වගාව සඳහා ජලසම්පාදන පහසුකම් තිබීම අත්‍යාවශ්‍යය. කප්පාදුවෙන් පසුව අවම වශයෙන් මාස තුනක පමණ වියළි කාළගුණික තත්වයක් පැවතීමද වැදගත්ය. එනිසා මිදි වගාව සඳහා වැදගත් වන්නේ යම් ප්‍රදේශයකට ලැබෙන මුළු වර්ෂාපතනය නොව, එය වසර පුරා කෙසේ ව්‍යාප්ත වි තිබේද යන්නයි.

වායුගෝලයේ ආර්ද්‍රතාවය හා උෂ්ණත්වය වැඩි කාලවලදී වගාවේ පත්‍රවලට දිලීර රෝග වැලදීමට වැඩි හැකියාවක් තිබේ. මෙයට අමතරව ආර්ද්‍රතාවය හා වර්ෂාපතනය වැඩි වූ විට වගාවේ මල් හැලීම වැඩිවේ. එමෙන්ම ගෙඩි වැඩි සංඛ්‍යාවක් පිපිරීමට ද ඉඩ ඇත.

මිදි වගාව සුළඟින් ආරක්ෂා කර ගැනීම ද වැදගත්ය. දරුණු සුළඟ නිසා, පස වියළී යාමට අමතරව වගාවේ වැල් සහ ගෙඩි වලටද හානි සිදුවිය හැකිය.

## පස

මිදි වගාව සඳහා ඉතාම යෝග්‍ය වන්නේ ඉතා හොඳින් ජලය බැස යන, සැහැල්ලු, ගැඹුරු පසකි. පසෙහි මැටි ස්වභාවය අධිකවීම මෙම බෝගයට එතරම් සුදුසු නොවේ.

පසෙහි ගැඹුර මීටර් 2 - 2 1/2 පමණ තිබේ නම් වගාවේ මුල් වර්ධනය ඉතා හොඳින් සිදුවීමට අවකාශ ලැබේ. පස මතුපිටට ආසන්නව තද ගල් ස්ථරයක් පවතින චූර්ණමය නොවන දුඹුරු පස් ඇති අරලගංවිල හා අම්පාර දිස්ත්‍රික්කයේ සමහර ප්‍රදේශ මිදි වගාව සඳහා එතරම් සුදුසු නොවේ. මෙයට අමතරව ලවණ අධිකපස්වලද, ලවණ අධික ජලය පවතින ප්‍රදේශ වලද, සාර්ථකව මිදි වගා කළ නොහැකි වේ.

වියළි කලාපයේ භූමි පිහිටීම අනුව ඉඩමේ ඉහළම කොටස්වල පසෙහි ගැඹුර මීටර් 2 - 2 1/2 පමණ වූ, හොඳින් ජලය බැස යන, ජලසම්පාදන පහසුකම් සහිත හා හිරු එළිය හොඳින් ලැබෙන ස්ථාන මිදි වගාව සඳහා සුදුසුය. වර්ෂා කාල වලදී වුවද භූගත ජල මට්ටම පොළව මතුපිට සිට අවම වශයෙන් මීටර් 2-3 ක් පමණ ගැඹුරකට පහතින් පිහිටන ස්ථාන වීමද විශේෂයෙන් වැදගත්ය.

වගාව සඳහා පසෙහි පැවතිය යුතු වඩාත් සුදුසු පී.එච්. අගය 6.5-7.5 පමණ වේ.

## සුදුසු ප්‍රභේද

ශ්‍රී ලංකාවේ දැනට වාණිජ මට්ටමින් වගා කරනු ලබන ප්‍රභේද කිහිපයකි.

## කාඩිනල්



ගෙඩි රතු පාටට හුරු පැහැයක් ගනී. ඉදුණු ගෙඩි වල පොත්ත තුනීය. හොඳින් ඉදුණු ගෙඩි වල මනා පැණිරසයක් තිබේ. ප්‍රසන්න සුවඳක් ඇත. පොකුරේ ගෙඩි ලිහිල්ව පිහිටා තිබේ. එසේම මිදි පොකුරක ඇති ගෙඩි එකවරම ඉදේ.
අළුත් පළතුරක් ලෙස භාවිතා කළ හැකිය. කප්පාදු කර මාස 2 1/2 ක් පමණ ගත වූ පසු අස්වැන්න නෙලා ගත හැකිය.

## ඉස්‍රායල් බ්ලූ

ඉදුණු ගෙඩි තද දම් පාටට හුරු නිල් පැහැතිය. පොකුරු වල ගෙඩි තදින් ඇහිරී ඇති අතර, තරමක් දුරට එකවර ගෙඩි ඉදීම සිදුනොවේ. එසේ වුවද පොකුරේ සියලුම ගෙඩි ඉදුණු පසුව අස්වනු නෙලා ගත හැක.

ගෙඩි වල පොත්ත කාඩිනල් ප්‍රභේදයට වඩා ඝණකමය. එසේම මෙම ප්‍රභේදයේ ඉදුණු ගෙඩි කාඩිනල්වල තරම් පැණිරස නැත. ඉදුණු ගෙඩිවල තරමක කහට රසයක්ද පවතී. මෙම ප්‍රභේදයේ ගෙඩි වල කාඩිනල් ප්‍රභේදයට වඩා වැඩි බීජ සංඛ්‍යාවක් දක්නට ලැබේ. අළුත් පළතුරක් ලෙස



ආහාරයට ගන්නා ප්‍රභේදයකි. කප්පාදු කර මාස තුනක් පමණ ගත වූ පසු අස්වැන්න නෙලා ගත හැකිය.

## බ්ලැක් මස්කට්



ඉදුණු ගෙඩි තද දම් පාටට හුරු කළු පාටය. මධ්‍යස්ථ ප්‍රමාණයේ විශාලත්වයක් හා ප්‍රසන්න සුවඳක් ඇත. ගෙඩියක බීජ 1-2 පමණ පවතී. පොත්ත තුනීය. මදය තරමක් ඝණකමය. පොකුරේ ගෙඩි තරමක් ලිහිල්ව පිහිටා ඇත. ගෙඩි එකවර ඉදේ. ඒ සඳහා මාස තුනක් පමණ ගතවේ. අළුත් පළතුරක් ලෙස මෙන්ම වයින් නිපදවීම සඳහාද යොදගත හැකි ප්‍රභේදයකි.

## වැඩි දියුණු කළ ඉසබෙලා

මෙම ප්‍රභේදයේ ගෙඩි ඊශ්‍රායල් බිලු ප්‍රභේදයට වඩා ප්‍රමාණයෙන් කුඩාය. පොකුරේ ගෙඩි එකවර ඉදීමක් සිදුනොවේ. පොකුරේ ගෙඩි සියල්ලම ඉදෙන තෙක් නෙලීම ප්‍රමාද කළ යුතුය. මදය පොත්තෙන් පහසුවෙන් වෙන් නොවේ. ඉදුණු ගෙඩිවල පවා තරමක ඇඹුල් ගතියක් පවතී. ඉදුණු ගෙඩි දම් පාටය. බීජ සහිතය. ගෙඩි ඉදීමට මාස තුනක පමණ කාලයක් ගතවේ. මෙම ප්‍රභේදය යටි පුස් රෝගයට බොහෝ සෙයින් ප්‍රතිරෝධීය. එනිසා තෙත් කළාපයේ වුවද වගා කළ හැකිය. කෙසේ වුවද, වියළි කළාපයේ වාණිජ මට්ටමින් වගා කිරීම සඳහා මෙම ප්‍රභේදය නිර්දේශ කරනු නොලැබේ. වර්ෂයේ ඕනෑම කාලයකදී කප්පාදුකිරීමෙන් මල් හට ගැනේ. වයින් සෑදීම සඳහා යොදගත හැක.

## සෙමිලෝන්



ගෙඩි ප්‍රමාණයෙන් කුඩාය. ඉදීගෙන එන විට ලා කොල පාටට හුරු කහ පැහැයට හැරේ. පොකුරේ ගෙඩි තදින් ඇහිරී ඇත. ගෙඩි ඉදීම එකවර සිදු නොවේ. ඉදුණු ගෙඩි වල පවා තරමක ඇඹුල් රසයක් පවතී. සුදු වයින් නිපද වීම සඳහා යෝග්‍ය ප්‍රභේදයකි. කප්පාදු කර මාස තුනකින් අස්වනු නෙලාගත හැක.

## තොම්සන් සීඩ්ලස්



මෙම වර්ගය අළුත් පළතුරක් ලෙස පමණක්ම නොව වියළි මිදි නිපදවීම සඳහාද බහුල වශයෙන් යොදා ගැනේ. ඉතා පැණිරස ඉදුණු ගෙඩි කොළ පැහැයට හුරු රන්වන් කහ පැහැයක් ගනී. ඒවායේ බීජ නැත. මල් හටගෙන අස්වැන්න නෙලා ගැනීමට මාස 3ක් පමණ ගතවේ. හෝමෝන භාවිතා කර හෝ ගෙඩි අතින් තුනී කර හෝ ගෙඩි වල විශාලත්වය වැඩි කර ගත හැකිය. හොඳින් ඉදුණු ගෙඩි ඉතා පහසුවෙන් නටුවෙන් ගැලවී වැටේ.

## මස්කට් එම්.අයි. (මස්කට් හැම්බර්ග්)



ඉදුණු ගෙඩි තද දම් පාටය. මිදි පොකුරේ නටුව ඉතා කෙටි නිසා නෙලිමේදී වැලට හා ගෙඩිවලට හානි නොවීමට විශේෂයෙන් වග බලා ගතයුතුය. ගෙඩි මධ්‍යස්ථ ප්‍රමාණයෙන් යුක්තය. පොකුර කේතු ආකාර හැඩයකින් යුතුය.

මෙම වර්ගයේ විශේෂ ලක්ෂණයක් වන්නේ, කප්පාදු කළ යුතු වඩා සුදුසු අවස්ථාවේ මඳ වෙනස්කමක් සිදු වුවද එය මල් හා ගෙඩි හට ගැනීම කෙරෙහි දැඩි බලපෑමක් ඇති නොකිරීමයි. කප්පාදුවෙන් පසු මාස තුනකදී පමණ අස්වනු නෙලා ගත හැකිය. මෙය අළුත් පළතුරක් ලෙස මෙන් ම රතු වයින් නිපදවීම සඳහාද සුදුසු වර්ගයකි.

# ප්‍රේන්ච් එම්.අයි. (ෆ්රෙන්ච් කොලොම්බාඩ්)



සුදු වයින් නිපදවීම සඳහා අප රටේ ඉදිරියේදී ව්‍යාප්ත කිරිමට බලාපොරොත්තුවන ප්‍රභේදයකි. කොළ පැහැති ගෙඩි ප්‍රමාණයෙන් තරමක් කුඩාය. පොකුරේ ගෙඩි තදින් ඇසිරී ඇත. ඉදුණු ගෙඩි කොළපාටය. පොකුරේ ගෙඩි ඉදීම ඒකාකාරිව සිදුවේ. යටි පුස් රෝගයට තරමක් ප්‍රතිරෝධිකය. යල හා මහ කන්න වල අස්වැන්න අතර පැහැදිලි වෙනස්කමක් නොපවතී.  මල් හටගෙන ගෙඩි නෙලීමට මාස තුනක් ගතවේ.

## පැළ නිෂ්පාදනය

බීජ, බද්ධ ක්‍රම, අතු බැඳීම හා දඬු කැබලි යන ක්‍රම මගින් මිදි පැළ නිපදවා ගත හැකිය. එහෙත් වාණිජ වගාවක් සඳහා අප රටේ වඩා සරල හා පහසු  ක්‍රමය වන්නේ දඬු කැබලි මගින් පැළ සකස් කර ගැනිමයි.

## දඬු කැබලි මඟින් පැළ නිපදවා ගැනීම

### වැල් තෝරා ගැනීම

පැළ නිෂ්පාදනය කර ගැනිම සඳහා දඬු කැබලි ලබා ගත යුත්තේ තෝරා ගත් වැල්වලින් පමණි. මේ සඳහා උසස් අස්වැන්නක් ලබා දෙන නිරෝගි, ගුණාත්මයෙන් වැඩි ගෙඩි හට ගන්නා, ප්‍රදේශයට වඩා ගැළපෙන ප්‍රභේදයක වැල් තෝරා ගන්න.

සාමාන්‍යයෙන් දඬු කැබලි ලබා ගන්නේ මිදි වැල් කප්පාදු කරන අවස්ථාවේදිය.

### දඬු කැබලි තෝරා ගැනීම

මුල් අද්දවා ගැනීම සඳහා සුදුසු දඬු කැබලි තෝරා ගැනිමේදී පහත සඳහන් කරුණු පිළිබඳව විශේෂයෙන් සැළකිලිමත් වන්න.

පසු ගිය කන්නයේ කප්පාදුවෙන් පසුව හට ගත් දුඹුරු පැහැති, මේරූ, නිරෝගි දඬු (දල දඬු) තෝරා ගන්න. දඬු කැබැල්ලේ අංකුර අක්‍රිය තත්වයේ පැවතිය යුතුය.

මෙම  දඬු පැන්සලයක විෂ්කම්භයට වඩා වැඩි විය යුතුය. එනම්, විෂ්කම්භය සෙන්ටි මීටරයක් පමණ විම වඩා සුදුසුය. දඬුවල විෂ්කම්භය මෙයට වඩා වැඩි හෝ අඩු හෝ වුවහොත් මුල් හට  ගැනීම අඩු විය හැකිය.
මුල් අද්දවා ගැනීම සඳහා යොද ගන්නා දඬු කැබැල්ලක් සෙන්ටි මිටර් 25-30 (අගල් 10-12) දිග වන පරිදි සහ ගැට 4 පමණ අඩංගුවන සේ කපාගන්න.  මෙවැනි දඬු කැබැල්ලක අවම වශයෙන් ගැට 3-4ක් වත් තිබිම අත්‍යාවශ්‍යය.
දඬු  කැබැල්ලේ යාබද ගැට දෙකක් අතර (පර්වයක) දුර අගල් 3ක් (සෙන්ටි මිටර් 6.5-7) පමණවත් වියයුතුය.

දෙසැම්බර් මස කප්පාදුවෙන් ලබා ගන්නා අතු කැබලි වලින් වඩා සාර්ථකව මුල් අද්දවා ගත හැකි බව පෙනීගොස් තිබේ.

දඬු කැබැල්ලක යාබද ගැට දෙකක් අතර දුර (පර්වයක) ඉතා වැඩි වු විට එහි අඩංගු තැන්පත් ආහාර ප්‍රමාණය අඩුය. එසේම පර්ව ඉතා කෙටි නම් එය රෝගයක් හෝ වෙනත් අයහපත් තත්වයක් නිසා හෝ විය හැකිය. ඒ නිසා මෙවැනි දඬු කැබලි මුල් අද්දවා ගැනිම සඳහා යොද ගැනිමට එතරම් සුදුසු නොවේ.

# දඬු කැබලි සකසා ගැනීම

මුල් අද්දවා ගැනිමට දඬු කැබලි සකසා ගැනීමේදී දඬු කැබැල්ලේ ඉහලින්ම ඇති ගැටයේ සිට සෙන්ටි මීටර් 01 ක් (අගල් 1/2 ) පමණ ඉහලින් හරස් අතට කපාගන්න. ඉන් පසු දඬු කැබැල්ලේ පහතින්ම ඇති අංකුරයට විරුද්ධ දිශාවෙන් ගැටයට ආසන්නයෙන් ආනතව කැපුමක් යොදන්න.


නිවැරදිව කැපුම යෙදීම

මෙමගින් දඬු කැබැල්ලේ ඉහල හා පහල කෙලවරවල් පහසුවෙන් හඳුනා ගත හැකිය. මෙයට අමතරව ඉහල කෙළවරින් ජලය හානි විමද අවම වේ. පහල කැපුම් තලය ආනත හැඩයක් ගන්නා නිසා එහි මතු පිට ක්ෂේත්‍රඵලය වැඩිවේ. එය මුල් හට ගැනීමට හේතු වන "කිනක පටක" වැඩි ප්‍රමාණයක් හට ගන්වා ගැනීමට උපකාරි වේ.
ඉහත අන්දමට කපා ගත් දඬු කැබලි කැප්ටාන් වැනි දිලීර නාශක ද්‍රාවණයක විනාඩි 05ක් පමණ කාලයක් සම්පූර්ණයෙන් ගිල්වා තබන්න. මෙය වැදගත් වන්නේ දිලීර රෝග වලින් දඬු කැබලි ආරක්ෂා කර ගැනිම සඳහාය.

# මුල් අද්දවා ගැනීමට සුදනම් කිරීම

කපා ගත් දඬු කැබලි එකවරම පොලිතින් බඳුන්වල සිටුවීම සුදුසු නොවේ. මෙවැනි දඬු කැබලි වලින් පැළ නිපදවා ගැනීමේ හැකියාව ඇත්තේ 10% ක් පමණ ඉතා අඩු මට්ටමකය.

මුල් අද්දවා ගැනීම ක්‍රම කිහිපයකට කළ හැකිය. මෙහි පහත සඳහන් පළමු ක්‍රම තුන සඳහා කැබලි 25 ක් පමණ සංඛ්‍යාවක් අඩංගුවන පරිදි දඬු කැබලි මිටි වශයෙන් බැඳ ගන්න.

## (1) වැලි බඳුනක් යොද ගැනීම

මේ සඳහා සෙවන සහිත ස්ථානයක ලී හෝ ගඩොල් වලින් හෝ සෙන්ටි මීටර් 45ක් පමණ උස පෙට්ටියක් සාදගන්න. මෙහි දිග සහ පළල මුල් අද්දවා ගත යුතු දඬු ප්‍රමාණය මත තීරණය කරගන්න.
පෙට්ටියේ පතුලට සෙන්ටි මීටර් 15 (අගල් 6 ) පමණ පිරිසිදු වැලි තට්ටුවක් දමා, එය මත දඬු කැබලි මිටි හරස් අතට සිටින සේ තට්ටු වශයෙන් අසුරන්න. මෙලෙස තැන්පත් කරනු ලබන සෑම දඬු කැබලි මිටි තට්ටුවක්ම වැලි තට්ටුවකින් වසන්න.

දඩුකැබලි මිටි තැන්පත් කරන අයුරු



ඉන් පසු ඉහළින්ම තැන්පත් කළ දඬු කැබලි මිටි සම්පූර්ණයෙන්ම වැසී යන පරිදි සෙන්ටි මීටර් 10 (අඟල් 4) පමණ ඝණකමක් සහිත වැලි තට්ටුවක් දමන්න.



සම්පූර්ණකල වැලි බඳුනක හරස්කඩක්

මෙම වැලි තට්ටුව හොඳින් තෙත් කර තෙත් ගෝනියකින් වසන්න.

වැලි තට්ටුව වියළී යාම වළකා ගැනීම සඳහා වරින් වර එයට ජලය සපයන්න.




දඬු කැබලි මිටි තැන්පත් කර ඇති ආකාරය

වැලි බඳුනෙහි තැන්පත් කර දින 10-15 පමණ ගත වූ පසු දඬු කැබලි වල කැපුම් පෘෂ්ඨය මත ඉදිමුමක් වැනි වර්ධනයක් (කිනක) ඇතිවේ. මෙලෙස කිනක පටක හොඳින් වර්ධනය වී ඇති දඬු කැබලි බඳුන් කිරීම සඳහා සුදුසුය. කිනක වැඩී නොමැති දඬු කැබලි තෝරා නැවත වැලි බඳුනේ තැන්පත් කර තව දින කිහිපයක් තිබීමට ඉඩ හරින්න.

## (2) පොලිතීන් බඳුන් යොදා ගැනීම

සෙන්ටි මීටර් 30 ක් පමණ පළල හා සෙන්ටි මීටර් 50-60 පමණ දිග පොලිතීන් කැබලි ගෙන එහි එක් කෙළවරක් මුද්‍රා තබන්න (සීල් කරන්න). ඉන්පසු දිලීර නාශක ද්‍රාවණයේ ගිල්වාගත් දඬු කැබලි මිටියක් එය තුලට දමා පොලිතීන් බඳුනේ ඉතිරි කෙළවර ද මුද්‍රා තබන්න.

මේ අන්දමට දඹු කැබලි අඩංගු පොලිතින් බඳුන් අඳුරු ස්ථානයක දින 10 ක් පමණ තැන්පත් කර තබන්න. එවිට දඹු කැබලිවල කැපුම් පෘෂ්ඨ මත කිනක වර්ධනය වේ. මේ බව පොලිතීන් බඳුන පිටතින් පරීක්ෂා කළවිට ඉතා හොඳින් දැකගත හැකිය.

**දඹු කැබලි මිටිය තැන්පත්කර ඇති ආකාරය හරස්කඩ පෙනුම**



මෙයට අමතරව, දඹු කැබලි මිටි අඩංගු පොලිතින් බඳුන් අඳුරේ නොතබා ශීතකරණයක් තුල දින 8-10 පමණ කාලයක් තැන්පත් කිරීමෙන් ද කිනක වර්ධනය කරගත හැකිය.

## (3) කොහුබත් මාධ්‍යයක් යොදා ගැනීම

මෙහිදීද පෙර ක්‍රමයේදී මෙන් පොලිතින් බඳුන් සකසා එය තුලට දිලීර නාශක ද්‍රාවණයක ගිල්වාගත් දඹු කැබලි මිටියක් ඇතුල් කරන්න. ඉන්පසුව දඹු කැබලි මිටිය සම්පූර්ණයෙන්ම ආවරණය වන සේ තෙත කොහුබත් (ගුලියක් ලෙස අතින් තද කළ විට ජලය වැස්සෙන - නොවැස්සෙන පදමට තෙත් කළ) වලින් පුරවා පොලිතින් බඳුනේ විවෘත කෙළවර මුද්‍රා තබන්න.

**පදමට තෙත්කල කොහුබත්**





**කොහුබත් මාධ්‍යය තුල දඹු කැබලි මිටිය තැන්පත්කර ඇති ආකාරය හරස්කඩ පෙනුම**

මේ සඳහා යොදා ගන්නා කොහු බත් ද දිලීර නාශකයක් සමග මිශ්‍ර කිරීම වඩා සුදුසුය. මේ අන්දමට සකසාගත් පොලිතීන් බඳුන් සෙවන සහිත ස්ථානයක තැන්පත් කරන්න. දින 10-15 දී පමණ දඹු කැබලි වල කැපුම් තල මත කිනක වර්ධනය වේ.

ඉහත සඳහන් විවිධ ක්‍රම මගින් කිනක හොඳින් වර්ධනය කර ගත් දඹු කැබලි වලින් පමණක් තෝරාගෙන පොලිතින් බඳුන් වල සිටුවන්න. එවැනි දඹු කැබලි වලින් සාර්ථක ලෙස මුල් හට ගනී.

මෙම ක්‍රම අතුරින් වඩා සාර්ථකව දඹු මුල් අද්දවා ගත හැකි වන්නේ කොහුබත් මාධ්‍ය භාවිතා කළ විටය.

## (4) වැලි තවානක මුල් අද්දවා ගැනීම

වැලි තවාන් සඳහා සෙවන සහිත එලිමහන් ස්ථානයක් තෝරා ගන්න. මේ සඳහා මඩුවක්, හරිතාගාරයක් හෝ ශාක ප්‍රචාරණය සඳහා සකස් කර ගත් කුටියක් යොදා ගත හැකිය.

මෙම ස්ථානයේ සෙන්ටි මීටර් 12-15 (අඟල් 5-6) ඝණකමට සිටින සේ වැලි තට්ටුවක් දමා අවශ්‍ය දිග හා පළලට අනුව ගඩොල් හෝ ලී කැබලි වලින් අසුරා ගන්න. තවාන් සඳහා පිරිසිදු වැලි පමණක් භාවිතා කරන්න. එසේම යොදන ජලය පහසුවෙන් බැස යන ස්ථානයක තවාන සකස් කර ගත යුතුය.

දඬු කැබලි කපා ගත් විගස එහි පහල කෙලවර එනම් ආනතව කැපූ කෙලෙවර සමග දඬු කැබැල්ලේ ගැට දෙකක් වැලි වලින් යට වන සේ සිටුවන්න. සිටවූ දඬු කැබලි වියළී යාම වළකා ගැනීම සඳහා වරින් වර වැලි තවානට ප්‍රවේශමෙන් ජලය යොදන්න.

මේ අන්දමට වැලි තවානේ සිටුවා ගත් පැළ වලින් සති 4 ක් පමණ ගතවූ පසුව මුල් හට ගැනීම සිදුවේ. එවිට එවැනි දඬු පොලිතීන් බඳුන්වල සිටු විය හැකිය.

ගොවීන් වැඩිදෙනෙකු විසින් දැනට බහුල වශයෙන් අනුගමනය කරන්නේ මෙම ක්‍රමයයි. කෙසේ වුවද ඉහතින් විස්තර කර ඇති ක්‍රම තුන මගින් තරම් මෙමගින් සාර්ථක ප්‍රථිඵල නොලැබීමට ඉඩ තිබේ.

# බඳුන් සකසා ගැනීම

ගේජ් 250-300 පොලිතින්වලින් පළල සෙ.මී. 15 ක් හා උස සෙන්ටි මීටර් 25-30 ක් වූ බඳුන් සකසා ගන්න. දිරාපත්වූ ගොම හෝ කොම්පෝස්ට්, වැලි සහ මතුපිට පස්, සම අනුපාතයට මිශ්‍රකර ගැනීමෙන් බඳුන් මිශ්‍රණය සකසා ගන්න. කෙසේ වුවද මතුපිට පස්වල මැටි ප්‍රමාණය අනුව බඳුන් මිශ්‍රණය සඳහා භාවිතා කරනු ලබන වැලි සහ කොම්පෝස්ට් ප්‍රමාණය වෙනස් කරගන්න. ඉන් පසු සකස් කරගත් පොලිතින් බඳුන්වලට මෙම බඳුන් මිශ්‍රණය පුරවන්න.

# දඬු කැබලි සිටුවීම

පහළ කැපුම් පෘෂ්ඨයේ කිනක පටක සහ කුඩා කිරි මුල් හටගෙන ඇති හා දණ්ඩේ ඉහළ කෙළවර පත්‍ර අංකුර මෝදු වීමට ආසන්න වී ඇති දඬු කැබලි පමණක් බඳුන් කිරීම සඳහා තෝරා ගන්න. අවශ්‍ය ප්‍රමාණයට වඩා වැඩි දිගකින් යුතුව මුල් වැඩී ඇති සහ අංකුර වල පත්‍ර විහිදී ඇති දඬු කැබලි බඳුන් කළ විට වැඩි ප්‍රමාණයක් මියයාමට ඉඩ ඇත. මෙවැනි තත්වයක් ඇතිවන්නේ මුල් හට ගන්වා ගැනීම සඳහා යොදා ගන්නා මාධ්‍ය තුළ වැඩි කාලයක් දඬු කැබලි තිබීමට ඉඩ හැරීම නිසාය. දඬු කැබලි බඳුන් කිරීම සඳහා පළමුවෙන්ම සකස් කර ගත් බඳුන්, අඩක් පමණ නියමිත බඳුන් මාධ්‍යයෙන් පුරවා ගන්න. තෝරාගත් දඬු කැබැල්ල කිරි මුල් නොකැඩෙන පරිදි බඳුනෙහි හරි මැදින් බඳුන් මාධ්‍ය මත ප්‍රවේශමෙන් තැන්පත් කර එය මතට බඳුන් මධ්‍යයෙහි ඉතිරි කොටස දමන්න. අවම වශයෙන් දණ්ඩෙහි ගැට දෙකක්වත් බඳුන් මාධ්‍යයෙන් පිටතට සිටින සේ මාධ්‍ය පුරවා ගන්න. කෙසේ වුවද බඳුනට ජලය සැපයීම සාර්ථකව සිදුකර ගැනීම සඳහා බඳුනෙහි ඉහළ කෙළවරින් සෙන්ටි මීටර් 2-3 පමණ පහළින් සිටින සේ මාධ්‍ය පුරවා ගැනීම වැදගත්ය. සපයන වැඩි ජලය ඉවත්වීම සඳහා බඳුන්වල පහළින් සිදුරු කිහිපයක් සැකසීමද කළ යුතුය.



දඬු කැබලි නිවැරදිව බඳුන් කිරීම

මේ අන්දමට දඬු කැබලි සිටුවන ලද බඳුන් සෙවන සහිත ස්ථානයක තැන්පත් කර ජලය සපයන්න. පහළ කැපුම් තලයේ කිනක වර්ධනය වී ඇති දඬු කැබලි මෙලෙස සිටුවා සති 2-3 පමණ ගතවූ පසුව අංකුර වැඩීම ආරම්භ වේ. මේ අන්දමට බඳුන්වල සිටුවා ගත් දඬු කැබලි වලින් හටගන්නා පැළ, ක්ෂේත්‍රයේ සිටු වීමට සුදුසු අවස්ථාවට පත්වීමට මාස 3-4 පමණ කාලයක් ගතවේ.

කෙසේ වුවද මෙයට වැඩිකාලයක් බඳුන්වල පැළ තිබීමට ඉඩහැරීමෙන් පැළ වල වර්ධනය නැවති ඇති ස්වභාවයකට පත්වේ. මෙවැනි පැළ සිටුවීමට බලාපොරොත්තුවන අවස්ථාව එළඹීමට සති 2 කට පමණ පෙර, දණ්ඩේ හොඳින් මේරූ දුඹුරු පැහැති කොටසේ ගැට 2-3 ක් පමණ ඉතිරි වන සේ සෙසු කොටස් කපා ඉවත් කළ යුතුය.

# සිටුවීමට සුදුසු කාලය

අප රටේ වියළි කලාපයේ පවතින දේශගුණික තත්ව අනුව මිදි පැළ සිටුවීම සඳහා වඩාත් සුදුසු වන්නේ සාමාන්‍යයෙන් පෙබරවාරි සිට අගෝස්තු දක්වා කාලයන්හිදිය. තද වැසි කාලයන් හීදී පැළ සිටුවීම සුදුසු නොවේ.

තද වැසි කාලයන්හිදී සිටවූ පැළවල වර්ධනය දුර්වල වේ. මෙයට අමතරව පැළවලට රෝග වැලදී විනාශවීමට ඇති හැකියාවද වැඩිය.

වෙනත් බෝග සඳහා මෙන් නොව මිදි පැළ සිටුවිය යුතු වඩා යෝග්‍යතම අවස්ථාව ලෙස තිරණය කළ යුත්තේ වැසි සමය අවසාන වී ලැබෙන වියළි කාලය ආරම්භ වූ අවස්ථාවයි.

# වගාව සඳහා සුදුසු ස්ථානයක් තේරීම

මිදි වගාව සඳහා තෝරා ගත යුත්තේ හොඳින් හිරු එළිය ලැබෙන, තද සුළං වලින් ආවරණය වූ ජල සම්පාදන පහසුකම් සහිත ඉඩම්ය. මෙය සමතලා ඉඩමක් නම් වඩා සුදුසුය. තරමක් බෑවුම් සහිත ඉඩමක නම් සමෝච්ච ක්‍රමයට ජලය සැපයීමට පහසු වන පරිදි වේදිකා සකසා ගන්න. මෙමගින් වගාවට ජලය සැපයීම පහසුවේ.

# සිටුවීමේ පරතරය

මිදි සිටුවීම සඳහා අනුගමනය කළ යුතු පරතරය වැල් පුහුණු කිරීමට බලාපොරොත්තුවන ක්‍රමය අනුව වෙනස්වේ.

## පන්දලම් ක්‍රමය

පැළ අතර මීටර් 7.2 × පේළි අතර මීටර් 3.6
(අඩි 24 × අඩි 12)

## වැට ක්‍රමය

පැළ අතර මීටර් 3.6 × පේළි අතර මීටර් 1.8
(අඩි 12 × අඩි 6)

## පදුරු ක්‍රමය

පැළ අතර මීටර් 1.8 × පේළි අතර මීටර් 1.8
(අඩි 6 × අඩි 6)

# වලවල් සකසා ගැනීම

මිදි වැලක් වසර තිහක් පමණ කාලයක් දක්වා වුවද ආර්ථිකව ලාභදායිව සාර්ථකව නඩත්තු කළහැකිය. ඒ නිසා වගාව ආරම්භයේ සිටම විශේෂ අවධානයක් යොමු කර කටයුතු කළ යුතුය.

වගාවේ පැළ පේළි පිහිටන දිසාව, ජලසම්පාදන ක්‍රමය, ඉඩමේ බෑවුම සහ සුළං හමන දිසාව වැනි කරුණු මත තීරණය විය යුතුය. පළමුවෙන්ම වගාවට ජලය සැපයීමට බලාපොරොත්තු වන්නේ කුමන ආකාරයටද යන්න පිළිබඳව දල අදහසක් හෝ තිබීම වැදගත්ය. උදහරණයක් ලෙස මතුපිට කානු පද්ධතියක් යොදගෙන ජලසම්පාදනය කිරීමට බලාපොරොත්තුවන්නේ නම්, පේළි විහිදිය යුත්තේ ඉඩමේ බෑවුමට හරස් අතටය.
සුළඟ නිසා වැල්වලට ඇති විය හැකි හානි ද හැකිතාක් දුරට අඩු කර ගත හැකිය. මේ සඳහා සෑම අවස්ථාවකදීම, මැසි ක්‍රමයේදී නම් මීටර් 7.2 ක පරතරය ලබා දෙන දිසාවද, වැට ක්‍රමයේදී නම් වැට පිහිටන දිසාව ද සුළං හමන දිසාවට සමාන්තර විය යුතුය.

කෙසේ වුවද විශේෂයෙන් වැදගත් වන්නේ ජලසම්පාදන ක්‍රමයට ගැලපෙන පරිදි වගාවේ පේළි සකසා ගැනීමයි.

පැළ සිටුවීම සඳහා සකස් කරනු ලබන වලක දිග, පළල හා උස අවම වශයෙන් මීටරයක් බැගින් විය යුතුය. වල කැපීමේදී මතුපිට පස් හා යටි පස් වෙන් වෙන් වශයෙන් වල අසල ගොඩ කරන්න.




මෙසේ ලැබෙන යටි පස නැවත වල පිරවීම සඳහා භාවිතා නොකරන්න. කපාගත් සෑම වලක් සඳහාම හොඳින් දිරාපත්වූ ගොම පොහොර හෝ කාබනික පොහොර විල්බැරැක්ක තුනක් පමණ (කිලෝ ග්‍රෑම් 50) අවශ්‍යවේ. ඉන්පසුව වල කැපීමේදී වෙන්කර ගත් මතුපිට පස්, අවට ප්‍රදේශයෙන් ලබාගත් මතුපිට පස් හා කාබනික පොහොර සමග වල අසලදීම කලවම්කර එම මිශ්‍රණයෙන් වල පුරවන්න.



ඉන් පසු මාසයක් පමණ කාලයක් මෙම මිශ්‍රණය වලෙහි හොඳින් තැන්පත් වීමට ඉඩ හරින්න.

පැල සිටුවීමට දින කිහිපයකට පෙර මූලික පොහොර ලෙස යෙදිය යුතු රසායනික පොහොර ප්‍රමානය වලට යොදන්න. මෙම රසායනික පොහොර, වලෙහි මතුපිට ප්‍රදේශයේ ඇති කාබනික හා මතුපිට පස් සමග පමණක් කවලම් කරගැනීම ප්‍රමාණවත් නොවේ. එවිට සිටුවීමෙන් පසු පැළ මිය යාමට ඉඩ තිබේ. ඒ නිසා මූලික පොහොර, වලෙහි ඇති මතු පිට පස් හා කාබනික පොහොර සම්පූර්ණ ප්‍රමාණයම සමග ඉතා හොඳින් කවළම් කරගන්න.

## පැල සිටුවීම

පළමුව, මිදි පැල අඩංගු බඳුන්වල පොලිතීනය ඉවත් කරන්න. ඉන්පසු සකස් කරගත් වල මැදට වන සේ පැලය ප්‍රවේශමෙන් සිටුවන්න. පැලය සිටුවීමේදී බඳුන් මාධ්‍යය විසිරී නොයාමට වග බලාගන්න.

මාස 4 ට වඩා වැඩි කාලයක් බඳුනේ තිබූ මිදි පැල සිටුවීමට පෙර, බඳුන පතුලේ ගැට ගැසී ඇති මුල් තට්ටුව කපා ඉවත් කරන්න. පොලිතීනය ඉවත් කරන අවස්ථාවේදී බඳුන පතුලේ සිට සෙන්ටිමීටරයක් පමණ ඉහළින් කපා දැමීමෙන් මෙම මුල් තට්ටුව ඉවත් කළ හැකිය.

එසේම සිටුවන අවස්ථාව වන විට පැලය බඳුන් කර වැඩි කාලයක් ගත වී තිබේ නම්, එහි රිකිල්ල අනවශ්‍ය පරිදි දික් වී තිබීමට ඉඩ තිබේ. එවිට පැලයේ මේරූ දුඹුරු පැහැති ගැට 2-3 පමණ ඉතිරිවන සේ, සිටුවීමට සති 2 පමණ පෙර රිකිල්ලේ අග කෙළවර කපා දමා පැළ සිටුවන්න. පැලය සිටුවීමෙන් පසු ආධාරයක් ලෙස කෝටුවක් පැලයෙන් සෙන්ටිමීටර් 15ක් (අඟල් 6) පමණ දුරින් සිටුවා එයට පැලය බඳින්න.

## වැල් පුහුණු කිරීම

වැල් පුහුණු කිරීම මගින් ශක්තිමත් සැකිල්ලක් ලබා ගැනීමට ද, කප්පාදු කිරීම, කෘෂි රසායන ද්‍රව්‍ය යෙදීම, අස්වැන්න නෙලීම හා වෙනත් වගා කටයුතු පහසුවීමට ද හේතුවේ.

සාමාන්‍යයෙන් මිදි වැල් පුහුණු කිරීම සඳහා අනුගමනය කළ යුතු වඩා සුදුසු ක්‍රමය තිරණය වන්නේ වගා කිරීමට බලාපොරොත්තුවන මිදි ප්‍රභේදයේ විශේෂ ලක්ෂණ මතය. එසේම, වගාව සඳහා වැය කළ හැකි මුදල් ප්‍රමාණය සහ මිදි අස්වැන්න කුමන කාර්යක් සඳහා යොදා ගැනීමට බලාපොරොත්තු වන්නේද යන්න මත ද අනුගමනය කළ යුතු වැල් පුහුණු කිරීමේ ක්‍රමය වෙනස්වේ.

## පන්දලම් ක්‍රමය

මේ සඳහා ආධාරක කණු වශයෙන් කොන්ක්‍රීට් හෝ කල්පවතින ලී කණු නැතහොත් ගැල්වනයිස් යකඩ බට භාවිතා කළ හැකිය. මිදි වැලක් වසර 30 පමණ කාලයක් ආර්ථිකව පවත්වාගත හැකි නිසා එයට සරිලන පරිදි පන්දලම සඳහා භාවිතා කරන ද්‍රව්‍ය තෝරා ගැනීම වැදගත්ය.



**පන්දලම් ක්‍රමයට සකස්කළ මිදි වගාවක්**

මීටර් 7.2 දිග හා මීටර් 3.6 පළල සෘජු කෝණාශ්‍රයක පැල සිටුවා ඇති වල හරි මැදට සිටින සේ ආධාරක කණු සිටුවන්න. මෙම ආධාරක කණුවක් සෙන්ටි මීටර් 240 පමණ (අඩි 8) උස විය යුතුය. කණුවේ සෙන්ටි මීටර් 60 (අඩි 2) පමණ උස ප්‍රදේශයක් දක්වා පසින් යට කිරීමෙන් පන්දලමේ උස සෙන්ටි මීටර් 180 (අඩි 6) පමණ මට්ටමකින් තබා ගත හැකිය.

කෙසේ වුවද පන්දලමේ උස තීරණය විය යුත්තේ වගාකරුට පහසුවෙන් අවශ්‍ය කාර්යන් ඉටු කර ගැනීමට ඉඩ සැලසෙන පරිදිය. මේ සඳහා අත ඉහලට එසවූ විට මැණික්කටුවෙහි මට්ටම, ආධාරක කණුවල ඉහල මට්ටම වන සේ උස සකස් කර ගත යුතුය. මෙම කණු මත ගැල්වනයිස් බට හෝ ශක්තිමත් ලී සහ ගේජ් 8 හා 12 කම්බි යොදා මැස්ස සකසා ගන්න.



පන්දලම් උස වගාකරුට පහසුවිය යුතුයි

මෙහිදී පළමුවෙන්ම පන්දලමේ පිටතින් සිටුවා ඇති ආධාරක කණු මත අඟලක විශ්කම්භයක් ඇති ගැල්වනයිස් බට, ශක්තිමත් ලී දඬු හෝ අඟල් 1×2 ප්‍රමාණයේ "එල්" හැඩැති යකඩ පටි යොදා හොඳින් තදකර ගන්න. විශාල පන්දලම් සඳහා මෙවැනි හැඩැති යකඩ පටි යොදා ගැනීම වඩා සුදුසුය.

ඉන් පසුව, පන්දලම ඇතුලතින් පිහිටි සෑම ආධාරක කණුවක් මතින්ම ගේජ් 8 හෝ 10 ප්‍රමාණයේ ඝනකම් කම්බි ඇද පන්දලමේ පිටත කණු සමග සම්බන්ධ කරන්න. පන්දලමේ පිටතින්ම ඇති ආධාරක කණු සිරස්ව තබා ගැනීමට හැකි වන පරිදි මෙම කම්බි, පන්දලමට පිටතින් පොළවෙහි ආනතව සවි කර ඇති කූඤ්ඤවලට තදින් ගැට ගසන්න.

එසේ නැතහොත් පන්දලමේ පිටතින්ම ඇති කණුවලට සෙන්ටි මීටර් 50 - 60 පමණ දුරකින්, තවත් කණුවක් පන්දලමට පිටතින් සිටුවන්න. ඉන්පසු එම කණු දෙක ඉනිමගක හරස් පටි පිහිටන ආකාරයට ස්ථාන 3 - 4 කින් පමණ යකඩ පටි දමා තද කර ගන්න. මෙම කණු දෙකටම තද වන සේ ආධාරක කණු වල ඉහළ කෙළවරින් කම්බි අදින්න.




පන්දලම ඉදිකිරීම

පන්දලමේ සැම යාබද කණු දෙකක් අතර පවතින මීටර් 3.8 දුර ප්‍රමාණය සමාන කොටස් 3 කට බෙදෙන සේ ගේජ් 8 හෝ 10 කම්බි අදින්න.

මෙම අවස්ථාව වන විට සැම කණු 4ක් අතර පවතින ඉඩ ප්‍රමාණය ගේජ් 8 හෝ 10 කම්බිවලින් සමාන ප්‍රමාණයේ කොටු 9කට බෙදී ඇති බව පෙනේ.

මෙයට පසුව පන්දලමේ දිග සහ පළල දෙපැත්ත ඔස්සේම සෙන්ටි මීටර් 25 - 30 පරතරයකින් ගේජ් 12 කම්බි ඇද හොඳින් තද කරගන්න. පන්දලම මත අදිනු ලබන ගේජ් 8 හෝ 10 සහ 12 ප්‍රමාණයේ කම්බි දෙවර්ගයම යෙදිය යුත්තේ එකිනෙක සමග ගෙතී ඇති ආකාරයටය. මූලික වියදම වැඩි වුවත් මෙය, අප රටේ වඩා




**නිවැරදිව කම්බි යෙදීම**

ජනප්‍රිය ක්‍රමයයි.

හොඳින් රැකබලා ගත් විට මිදි පැලය සිටුවා මාස 2 1/2 - 3 පමණ ගතවූ විට එය පන්දලම දක්වා වර්ධනය වේ. මිදි පැලය අසලින් සිටවූ කෝටුවේ ආධාරයෙන් මිදි පැලය පන්දලම දක්වා වැඩීමට සලස්වන්න.

පන්දලමේ සිට පහළට සෙන්ටිමීටර් 15 (අඟල් 6) පමණ මට්ටමක් දක්වා වැඩෙන තෙක් මිදි වැලෙන් පාර්ශ්වික අතු හට ගැනීමට ඉඩ නොදෙන්න. පන්දලම දක්වා වැඩුනු විට එහි කරටිය කපා දමන්න. පන්දලම ආසන්නයෙන් පාර්ශ්වික ශාඛා දෙකක් හට ගැනීමට ඉඩ හැර පන්දලමේ දිග




දිසාව ඔස්සේ දෙපසට වැඩීමට සලස්වන්න.

පන්දලම මත දෙපසට වර්ධනය වීමට සලස්වන ප්‍රාථමික ශාඛා වලින් නිසි පරතරයකට සිටින සේ ද්විතියික ශාඛා ලබාගත යුතුය. මේ සඳහා පළමුවෙන්ම ප්‍රධාන වැලෙන් දෙපසට වැඩීමට සලස්වන ප්‍රාථමික ශාකා සෙන්ටි මීටර් 30-40 පමණ දික්වූ පසුව අග්‍රස්ථය කපා දමන්න. එවිට ප්‍රාථමික ශාඛාව ආරම්භ වන ස්ථානය ආසන්නයෙන්ම ද්විතික ශාඛා දෙකක් දෙපසට වර්ධනය කර ගත හැකිය.



මේ අන්දමට වැලෙහි ප්‍රධාන සැකිල්ල ක්‍රමානුකූලව සකස් කර ගැනීම පිළිබඳව ආරම්භයේ සිටම විශේෂ අවධානයක් යොමු කරන්න. එමගින් පන්දලම මත ඒකාකාරව විසිරී පවතින පරිදි මිදි පොකුරු හට ගන්වා ගත හැකිය.

ඉන් පසුව සෑම සෙන්ටි මීටර් 60 පමණ දුරකින් ප්‍රාථමික ශාඛාවේ අග්‍රස්ථය කපා දමන්න. මෙය වැදගත් වන්නේ පන්දලමේ දිග අතට යොද ඇති කම්බි දිගේ, ප්‍රාථමික ශාඛාවේ සිට දෙපසට ද්විතියික ශාඛා දෙක බැගින් වර්ධනය කර ගැනීමට සහ ප්‍රාථමික ශාඛාව පන්දලම දිගේ ඉදිරියට වැඩීමට සලස්වා ගැනීම සඳහා එක් අංකුරයක් වර්ධනය කර ගැනීමට හැකවීම සඳහාය.

කෙසේ වුවද වැලකින් හටගන්නා ප්‍රාථමික ශාඛාවන් පන්දලම මත එක් දිසාවකට වැඩීමට ඉඩහැරිය යුතු දුර මීටර් 3.6කි. එයට හේතුව යාබද වැලෙන් හටගන්නා ප්‍රාථමික ශාඛාවට ද මෙම වැලෙහි ප්‍රාථමික ශාඛාව වැඩෙන දිසාවට විරුද්ධ දිසාව ඔස්සේ මීටර් 3.6 ක් දුරට වර්ධනය විමට ඉඩ සලසා දිය යුතු නිසාය.

මේ අන්දමට මිදි වැලකින් හටගන්නා ද්විතියික ශාඛාවක් පන්දලමේ හරස් අතට වැඩීමට ඉඩ හැරිය යුතු උපරිම දුර මීටර් 1.8 කි. එම ස්ථානයෙන් එහි අග්‍රස්ථය කපා දැමීමෙන් යාබද පේළියේ සිටුවා ඇති වැලෙන් හටගන්නා ද්විතියික ශාඛා වලටද මීටර් 1.8 ක දුරක් පන්දලමේ හරස් අතට වැඩීමට ඉඩ ලබා දිය හැකිය. මේ අනුව, පන්දලම් ක්‍රමය යටතේ නඩත්තු කරනු ලබන එක් මිදි වැලකින් හට ගන්නා ප්‍රාථමික හා ද්විතියික ශාඛා වලට පන්දලම මත වර්ග මීටර් 26 පමණ (වර්ග අඩි 288) ප්‍රදේශයක වර්ධනය විමට ඉඩ ලැබේ.




**පන්දලම මත ශාඛා පුහුණු කිරීම**

මේ අන්දමට වැල පුහුණු කිරීමේ ආරම්භක අවස්ථාවේ සිටම ද්විතියික ශාකාවන් නිසි පරතරයකින් වර්ධනය විමට ඉඩ සැළැස්විමට කටයුතු නොකළහොත් පන්දලම මත හොඳින් විහිදුන සැකිල්ලක් ඇති නොවේ. පන්දලම මත හිඩැස් ඇතිවන මෙවැනි දුර්වල සැකිල්ලක් සහිත මිදි වැලකින් ලබාගත හැක්කේ අඩු අස්වැන්නකි. මෙම ක්‍රමයේ ප්‍රධාන වාසි කිහිපයකි.

- වේගයෙන් වර්ධනය වන හා වර්ධන දිරිය වැඩි මිදි ප්‍රභේද සඳහා මෙය සුදුසු ක්‍රමයකි.
- පත්‍ර වලට හොඳින් සූර්යාලෝකය ලබා ගැනීමට අවස්ථාව ලැබේ.
- පත්‍ර සෙවනවීම අඩු නිසා වගාවට වැළදෙන බොහෝ දිලීර රෝග පාලනය කිරීම වඩා පහසුය.
- මිදි පොකුරු පන්දලමින් පහළට එල්ලී පිහිටන බැවින් සුළඟින් ආරක්ෂාවේ. විශේෂයෙන් අලුත් පළතුරක් සඳහා මිදි නිපදවන වගාවන් සඳහා මෙම ක්‍රමය වඩා සුදුසුය.
- අවශ්‍ය පරිදි වැල් කප්පාදු කර පන්දලම මත වැඩීමට සැළැස්විය හැකිය. එනිසා වැඩි අස්වැන්නක් ද ලබා ගැනීමට පිළිවන.
- පන්දලම යට වල් පැල වර්ධනය විම අඩුය.

කෙසේ වුවද මෙම ක්‍රමයට නඩත්තු කරන වගාවක් සඳහා පළිබෝධනාශක ඉසිමේදී විශේෂයෙන් ප්‍රවේශම් විය යුතුය.

එක් පන්දලමක උපරිම විශාලත්වය අක්කරභාගයක භූමි ප්‍රදේශයකට සීමා කරන්න. මෙයට වඩා විශාල වගාවන්හි නිශ්චිත කොටස් වශයෙන් වගාව පිහිටුවා වෙන් වෙන් වශයෙන් පන්දලම් සකසා ගන්න. මෙමගින් වගාවේ නඩත්තු කටයුතු පහසුවේ.

# වැට ක්‍රමය

සෑම යාබද කණු දෙකක් අතරම මිදි පැල එකක් පිහිටන සේ එකිනෙකට මීටර් 3.6ක (අඩි 12) දුරින් පේලිය එල්ලේ කණු සිටුවන්න. සිටුවීමෙන් පසුව මෙම කණුවක් පොළව මට්ටමේ සිට මීටර් 2ක් පමණ උස්ව තිබිය යුතුය. මෙම ආධාරක කණු එකිනෙක සම්බන්ධ වන සේ පොළව මට්ටමේ සිට මීටරයක් ඉහළින් සහ ආධාරකය කණුවේ ඉහළ කෙළවර ආසන්නයෙන් හරස් කම්බි අදින්න.

වැඩෙන මිදි පැලය අසලින් පැල නොවන දිග කෝටුවක් සිටුවන්න. එහි ආධාරකයෙන් මිදි පැලය සෘජුව වැඩීමට සලස්වන්න. මෙලෙස වැඩෙන මිදි පැලය පළමුවෙන් පහළ කම්බිය දක්වා වැඩීමට සලස්වන්න. මෙම කම්බියට පහළින් වැලෙහි ප්‍රධාන කඳෙන් හටගන්නා සියළුම පාර්ශ්වික අතු කපා ඉවත් කරන්න. එම කම්බිය ආසන්නයෙන් හටගන්නා පාර්ශවික ශාකා (ප්‍රාථමික) දෙකක් එකිනෙකට විරුද්ධ පැති වලට වැඩීමට ඉඩ හරින්න.

ඉන් පසු ඉහළ කම්බිය දක්වා වැල වැඩීමට ඉඩ හරින්න. කම්බියේ ඉහළ මට්ටමට මදක් ඉහළින් ප්‍රධාන වැලෙහි අග්‍රස්ථය කපා දමන්න. නැවතත් ඉහළ කම්බිය දිගේ පාර්ශ්වික ශාකා දෙකක් වැලෙහි දෙපසට වැඩීමට ඉඩ හරින්න. හරස් කම්බි දෙක අතර ප්‍රධාන වැලෙන් හටගන්නා අනවශ්‍ය පාර්ශ්වික ශාකාවල අග්‍රස්ථය කපා දමන්න.

මේ අන්දමට වැලකින් හට ගන්නා එක් පාර්ශ්වික ශාඛාවකට හරස් කම්බි දිගේ මීටර් 1.8 (අඩි 6 පමණ) දුරක් වැඩීමට ඉඩ සැලසිය හැකිය. ආධාරක කණුවක් දක්වා වැඩුනු පසුව පාර්ශ්වික ශාඛාවල අග්‍රස්ථය කපා දමන්න.




**වැට ක්‍රමයට පුහුණු කිරීම**

කම්බිය දිගේ වැඩීමට ඉඩ හරිනු ලබන ප්‍රාථමික ශාඛා වලින් ද්විතියික ශාඛා හට ගනී. එකිනෙකට සෙන්ටි මීටර් 30 - 45 පමණ (අඩි 1 - 1 1/2) පරතරයකින් ශක්තිමත් ද්විතියික ශාඛා ලබා ගැනීම වැදගත්ය. මේ සඳහා වරින්වර කම්බිය දිගේ වැඩෙන ප්‍රාථමික ශාඛාවේ අග්‍රස්ථය කපා දමන්න.



**ද්විතියික ශාඛා පුහුණු කිරීම**

මෙම ක්‍රමයට අනුව වගා නඩත්තුව පහසුය. මේ සඳහා පන්දලම් ක්‍රමයට තරම් මුදලක් වැය නොවේ. කෙසේ වුවද එක් වැලකින් ලබාගත හැකි අස්වැන්න පන්දලම් ක්‍රමයේ වැලකින් ලැබෙන අස්වැන්නට වඩා අඩුය.

# පඳුරු ක්‍රමය

මේ ක්‍රමයේදී මිදි පැල සිටුවන්නේ එකිනෙකට මීටර් 1.8 (අඩි 6) ක පරතරයකටය.

පැලය අසලින් සිටුවා ඇති ආධාරකයක් දිගේ මිදි වැල ඉහළට වැඩීමට සලස්වන්න. පොළව මට්ටමේ සිට අඩි 6ක් (මීටර් 1.8) ඉහළට වැල වැඩුණු පසු, එහි කරටිය කපා දමා පාර්ශ්වික ශාඛා 4 ක් එකිනෙකට විරුද්ධ දිසාවට වැඩීමට සලස්වන්න. ඊට පහලින් ඇති වන සියලුම පාර්ශ්වික ශාඛා ඉවත් කරන්න.



පඳුරු ක්‍රමයට පුහුණු කිරීම

ප්‍රධාන වැලෙන් හට ගන්නා ප්‍රාථමික ශාඛා හතරෙන් ද්විතික ශාඛා වැඩීමට ඉඩ හරින්න. ඉතාම ලාභදායි ක්‍රමය මෙයයි. නමුත් එක් වැලකින් ලබාගත හැකි අස්වැන්න ඉහත ක්‍රම දෙකටම වඩා අඩුය. ඉතා වේගයෙන් වර්ධනය නොවන ප්‍රභේද සඳහා මෙම ක්‍රමය වැඩි වශයෙන් යොදා ගනු ලැබේ. මේ අන්දමට නඩත්තු කරනු ලබන මිදි වැලක් ගෝලාකාර හැඩයකින් දිස් වේ. වෙනත් රටවල මෙම ක්‍රමය වැඩි වශයෙන් යොදා ගන්නේ වයින් සහ වියළි මිදි නිපදවීම සඳහා නඩත්තු කරනු ලබන වගාවන්හිය.

# "ජිනිවා ද්වි තිර" ක්‍රමය

**(Geneva Double Curtain Method,T ක්‍රමය)**



මෙහිදී වැට ක්‍රමයේ මෙන්ම පේළි වලට වැල් පිහිටු වන අතර, වැල් දෙකක් අතර පරතරය මීටර් 2.6 ක් හා පේළි දෙකක් අතර මීටර් 4 ක් වශයෙන් පවත්වා ගනු ලැබේ. මුලින් කී ආකාරයට වැට ක්‍රමයේ මෙන් කණු සිටු විය යුතු අතර, සෑම කණුවකම ඉහළ කෙළවරේ මීටර් 1 ක් දිග ලී පටියක් හෝ යකඩ බටයක් T හැඩය ලැබෙන සේ සවිකරගත යුතුය. ඉන් පසු ගේජ් 8 හෝ ගේජ් 10 ප්‍රමානයේ කම්බි 3 ක් ඉහත විස්තර කළ බාහුවේ දෙකෙළවර හා මැදින් සිටින සේ සවි කරන්න. මේවා අනෙක් කණුවලට ඒ ආකාරයටම තදින් සම්බන්ධ කරගන්න. මෙය වැඩි වෝල්ටියතාවයක් ඇති විදුලි රැහැන් ඇද ඇති ආකාරයට දිස් වේ. මෙම කම්බිය නිසා මෙම කණු සවිමත්ව පොළවේ රැඳි සිටීමට උපකාරීවේ. අතරින් පතර ගේජ් 12 හරස් කම්බි තිරස්ව යෙදිය හැක



**කිරීමේ පරතරයන්**

# කප්පාදු කිරීම

මිදි වැලක් කප්පාදු කිරීමේදී මූලික වශයෙන් සිදුවන්නේ ලපටි හා තරමක් මේරූ දඬු කොටස් හා පත්‍ර ඉවත් කිරීමයි. මිදි වැලක් කප්පාදු කිරීමෙන් ලැබෙන වාසි කිහිපයකි.

කප්පාදු කිරීම නිසා අඩු ශ්‍රමයකින්, රෝග හා පළිබෝධ පාලනය, අස්වැන්න නෙලීම හා වෙනත් වැදගත් වගා පාලන කටයුතු පහසුවන ආකාරයට මිදි වැල සකසා ගැනීමට ඉඩ ලැබේ.

වැල විහිදී ඇති ප්‍රදේශ තුල ඒකාකාරව එල හටගන්නා අංකුර නිපදවා ගැනීමට ද, දිගු කාලීනව වැලකින් ලබා ගන්නා අස්වැන්න සැලකිය යුතු මට්ටමකින් අඩු වැඩි නොවී පවත්වා ගැනීමටද, කප්පාදුව මගින් හැකියාව ලැබේ.

මිදි වැලකින් ගුණාත්මයෙන් වැඩි අස්වැන්නක් ලබා ගැනීමටද සාර්ථක කප්පාදුවක් නිසා ඉඩ සැලසේ.
මිදි වැලකින් සතුටුදයක අස්වැන්නක් ලබා ගැනීම සඳහා එය නිවැරදි අන්දමට කප්පාදු කළ යුතුයි. බොහෝ මිදි වගාවන්ගෙන් සතුටුදයක අස්වැන්නක් ලබාගත නොහැකිවී ඇත්තේ ක්‍රමවත් අන්දමට කප්පාදු කිරීම සිදුනොකරන නිසාය. මිදි වැලක මල් හටගන්නේ මෙම කන්නයේදී හටගත් අළුත් රිකිලි වලය. මෙවැනි අළුත් රිකිලි වැඩි සංඛ්‍යාවක් හටගන්වා ගැනීම සඳහා කප්පාදු කිරීම අතිශයින් වැදගත් වගා පාලන කටයුත්තක් ලෙස සලකනු ලැබේ.

මිදි වැලෙහි ද්විතියික ශාඛාවන්හි තද දුඹුරු පැහැවී ඇති ප්‍රදේශයේ හොඳින් වැඩුනු අංකුර කීපයක් ඉතිරි කර සෙසු කොටස් කපා ඉවත් කරන්න. මේ අන්දමට දඬු කැබැල්ලක ඉතිරි කරනු ලබන අංකුර සංඛ්‍යාව, වගා කර ඇති මිදි ප්‍රභේදය, එහි මල් හට ගැනීමේ ස්වභාවය, එනම් පුෂ්ප හටගන්නා අංකුර පිහිටි ප්‍රදේශය, වැලේ වයස, දිරිය වැනි කරුණු මත අඩු වැඩිවේ. මේ අන්දමට කප්පාදු කළ වැලක සියළුම කොළ පැහැති දඬු කොටස් ඉවත්වී තිබිය යුතුය. කප්පාදුව නිසා, සාමාන්‍යයෙන් මිදි වැලක එම කන්නයේ වර්ධනය වූ දඬු කොටස් වලින් 80 - 90% පමණ ඉවත් වේ.

එතරම් වයස් ගත නොවූ සහ වර්ධන දිරිය අඩු වැල් කප්පාදු කරන විට ද්විතියික ශාඛාවන්හි අංකුර 2-3 පමණ ඉතිරි කරන්න. මෙමගින් වැලෙහි ශක්තිමත් සැකිල්ලක් ඇති කර ගත හැකිය.

වේගයෙන් වැඩෙන, දිරිය වැඩි වැල් කප්පාදු කරන විට ද්විතියික ශාඛා වල අංකුර 4-6 ක් පමණ සංඛ්‍යාවක් ඉතිරි කරන්න. වගා කර ඇති මිදි ප්‍රභේදය අනුවද කප්පාදුවේදි ඉතිරි කළ යුතු අංකුර සංඛ්‍යාව තීරණය වේ. කෙසේ වුවද සාමාන්‍ය කප්පාදුවක් නිසා මිදි වැලෙහි ප්‍රධාන සැකිල්ලට හානි නොවීමට වග බලා ගන්න. ඊශ්‍රයල් බ්ලූ ප්‍රභේදයට අයත් මිදි වැලක් කප්පාදු කරන විට හොඳින් වැඩුන දණ්ඩක අංකුර (ගැට) 4-6 පමණ ඉතිරි කරන්න. නමුත් කප්පාදු කරනු ලබන දණ්ඩ දුර්වල නම් (ඝණකම පැන්සලකට වඩා අඩු නම්) එහි ගැට දෙකක් පමණ අඩු සංඛ්‍යාවක් ඉතිරි කරන්න. දණ්ඩේ ඝණකම මහපටඟිල්ලක් තරම් වූ විට එහි ගැට 4-5 ක් පමණ ඉතිරි කරන්න. තොම්සන් සීඩ්ලස් ප්‍රභේදයට අයත් මිදි වැල් කප්පාදු කළ යුත්තේ දණ්ඩක ගැට (අංකුර) 8-12 ක් පමණ ඉතිරි වන පරිදිය. නමුත් මෙම ප්‍රභේදයේ ඝණකමින් අඩු දුර්වල දඬු සඳහා ගැට 3- 4 ක්ද ඝණකම වැඩි දඬු සඳහා ගැට 12 ක් පමණද ඉතිරි කළ යුතුය.

මේ අන්දමට එක් එක් ප්‍රභේද සඳහා අනුගමනය කළ යුතු කප්පාදුවේදි දණ්ඩේ ඉතිරි කළ යුතු අංකුර (ගැට) ප්‍රමාණය තීරණය වන්නේ එම ප්‍රභේදයේ දඬු වල, පුෂ්ප අංකුර පිහිටා ඇති ප්‍රදේශය අනුවය. එකිනෙකට දුරින් ගැට පිහිටා ඇති මෙන්ම පැතලි කඳක් ඇති දඬුකැබලි වල එල දැරීම අඩුය. ඒනිසා මෙවැනි දඬු කොටස් අංකුර 2 ක් පමණ ඉතිරි කර කපා ඉවත් කරන්න.

ශ්‍රී ලංකාව වැනි රටවල වසරකට දෙවතාවක් මිදි වැල් කප්පාදු කර දෙවරක් අස්වනු ලබා ගත හැකිය. කප්පාදු කළ යුත්තේ මාස 3 ක පමණ දිගු වියළි කාළගුණයක් ඉදිරියේදී ලැබේ යැයි බලාපොරොත්තුවෙනි. මේ කාලය තුළද මල් හට ගැනිම, ගෙඩි හට ගැනීම, ගෙඩි ඉදී අස්වනු නෙළීම, යන සියළුම දේ සිදුවිය යුතුය. එනිසා අප රටේ යල කන්නයේදී මැයි අග සිට ජුනි මුල් භාගය දක්වාද, මහ කන්නයේදී දෙසැම්බර් අග සිට ජනවාරි මුල් භාගය දක්වාද කප්පාදු කළ හැකිය.

මිදි කප්පාදු කිරීම වැලෙහි වර්ධනය නැවති ඇති (අක්‍රිය) අවස්ථාවකදී කළ යුතුය. මෙවැනි අවස්ථාවක් බොහෝ විට දැකිය හැකි වන්නේ ඉහත සඳහන් කාලවකවාණු වලදිය.

කප්පාදු කිරීමට සුදුසු අවස්ථාවට පත්වී ඇති වැලක් පහසුවෙන් හඳුනා ගත හැකි ලක්ෂණ කිහිපයක් තිබේ. ද්වීතියික ශාඛාවල වඩා මේරූ පත්‍ර කිහිපයක් කහ පැහැගැන්වී තිබීම හෝ පත්‍ර හැලී යාම, වැලෙහි අළුත් දලු හටගැනීම නැවති ඇති ආකාරයක් පෙන්නුම් කිරීම හා දඬුවල කෙලවරින්ම පිහිටි පත්‍ර හොඳින් මේරී තිබීම මේ අතර ප්‍රධාන වේ.

අප රටේ පවතින කාළගුණික තත්ව අනුව වියළි යල කන්නයකදී ඉහත ලක්ෂණ පෙන්නුම් කරන අවධිය, සතියක පමණ කාලයක් තුළදී පැහැදිලිව දැක ගත හැකිය.  නමුත් මාස් කන්නයේදී මේ අන්දමට වැල්වල අක්‍රිය අවස්ථාවක් පැහැදිළිව දැක ගැනීම අපහසුය. මිදි වැල අක්‍රිය තත්වයට පත්වී ඇති බව දුටු විගස, එයට ජලය සැපයීම නවත්වන්න.

සාමන්‍යයෙන් පස් වර්ග අනුව අවම වශයෙන් දින 10 ක් වත් රතු දුඹුරු පස්වල ජලය රහිතව පස වියළි කළ යුතුය. වැලි හෝ වැලි ලෝම පස් (කල්පිටිය) දින 4ක් පමණ ජලය නැවැත්වීම සෑහේ.

පස් වර්ග අනුව රතු දුඹුරු පස් වැනි ඒවායේ පාදයේ සිට මීටරයක් පමණ දුරකින් සෙන්ටි මීටර් 30 ක් පමණ පළල හා සෙන්ටි මීටර් 25 ක් පමණ ගැඹුර කාණුවක් කපන්න. කාණුව සැකසීමේදී පැන්සලක් පමණ විශාලත්වයක් සහිත මුල් ඉතිරි කර සෙසු කුඩා මුල් සියල්ල කපා දමන්න. මාස් කන්නයේ වැල වටා කාණුවක් කැපීම අත්‍යාවශ්‍ය නොවේ.

සාමාන්‍යයෙන් මේ අන්දමට වැල වටා කාණු කැපූ දින සිට දින 5-7 ක් පමණ ගත වූ පසු කප්පාදු කළ හැකිය. එහෙත් වැලි පස් ඇති කල්පිටිය වැනි ප්‍රදේශවල මෙසේ කානු දැමීම අවශ්‍යනොවේ.

කැපුම් වලින් දියර ගැලීමක් සිදු නොවන්නේ නම් කප්පාදු කිරීම සඳහා හොඳින් පස වියළී ඇති බව පෙන්නුම් කරයි.

කප්පාදුකර දින 5-7 ක් පමණ ගත වූ පසුව හෝ වැලෙහි අංකුර වලින් 50% ක් පමණ ප්‍රමානයක වර්ධනය ආරම්භ වූ අවස්ථාවේදී හෝ වැල වටා කපා ඇති නොගැඹුරු  කාණුව පිරෙන සේ දිරා පත්වූ ගොම පොහොර හා නියමිත රසායනික පොහොර ප්‍රමාණය යොද ජලය සපයන්න. කෙසේ වෙතත් යල් කන්නයේදී කරනු ලබන කප්පාදුව මගින් මාස් කන්නයේදී ්‍රට වඩා වැඩි අස්වැන්නක් ලබාගත හැකිය. කප්පාදු කළ යුතු පැහැදිලි අක්‍රිය අවස්ථාවක් වගාවෙහි දැක ගත හැකිවීම හා පවතින වියළි කාළගුණික තත්වය නිසා දිලීර රෝග වැළඳීමේ හැකියාව අඩු වීම මෙයට හේතුවයි.

# පුනර්ජීවන කප්පාදුව

පන්දලම් ක්‍රමයේදී එක් වැලක් වැඩීමට ලබා දී ඇති ඉඩ ප්‍රමාණය වර්ග මීටර් 26 ක් පමණ වේ. වසර කීපයක් ගත වත්ම මෙම සම්පූර්ණ ප්‍රමාණයම වැසී යන අන්දමට වැල වැඩී ඇති බව දැක ගත හැකිය. මිදි පොකුරු හට ගන්නේ අළුත් රිකිලිවල නිසා ඉහත අන්දමට තව දුරටත් වැල නඩත්තු කළ හොත් ලබා ගත හැකි අස්වැන්න ක්‍රම ක්‍රමයෙන් අඩු වන බව පෙනේ.



මෙම තත්වය වලකා ගැනීම සඳහා වැලෙහි පැරණි සැකිල්ල ඉවත් කර ක්‍රමයෙන් නව සැකිල්ලක් ඇති කර ගැනීමට ඉඩ සලසා දිය යුතුය. මේ සඳහා ද්විතිය ශාඛාවල පෘෂ්ඨීමත් අංකුර 4-6 ක් පමණ ප්‍රාථමික ශාඛාවට ආසන්නව තබා කැපීමෙන් අලුත් රිකිලි ගත හැකිය. මෙය පුනර්ජීවන කප්පාදුව වශයෙන් හැඳින්වේ. පුනර්ජීවන කප්පාදුව සඳහා වඩාත් සුදුසු වන්නේ යල කන්නයි. මේ සඳහාද සාමාන්‍ය කප්පාදුවකදී මෙන්ම ක්ෂේත්‍රය සුදනම් කිරීම වැදගත්ය.

# ජල සම්පාදනය

වර්ෂාව නොමැති කාලවලදී අවම වශයෙන් සෑම දින 10 කට වරක් බැගින් වගාවට ජලය සපයන්න. නමුත් මෙය ප්‍රදේශය අනුව වෙනස්වේ. මිදි වගාවන් සඳහා පත්‍ර තෙමෙන ආකාරයට ජලය යෙදීමෙන් දිලීර රෝග හට ගැනීමේ අවදානම වැඩිවේ.

පෙර සඳහන් අන්දමට කප්පාදු කිරීමට දින 8-10 කට පමණ පෙර වගාවට ජලය සැපයීම නවත්වන්න. නැවත වරක් වැල්වලට ජලය ලබා දිය යුත්තේ කප්පාදු කර දින 3-4 ක් පමණ ගත වූ පසුවය.

මල් හට ගන්නා කාලයේදී වගාවට අවශ්‍ය තරම් ජලය නොලැබීම නිසා මල් වියළී යාම කුඩා ගෙඩි හැලී යාම නිසා අස්වැන්න අඩු විය හැකිය.

වගාවේ අස්වැන්න නෙලීමට දින 10 කට පමණ පෙර සිට ජල සම්පාදනය කිරීම නවත්වන්න. ගෙඩිවල පැණි රසය වැඩිවීමට මෙය උපකාර වේ.

මිදි වගාවට ලවන මිශ්‍රිත ජලය යෙදීම නොකරන්න.

# මතුපිට ජල සම්පාදනය

මතුපිට ජල සම්පාදන ක්‍රම අනුගමනය කරන්නේ නම් මිදි වැල වටා බේසමක් ආකාරයට පිහිටන සේ සකසා ජලය ලබා දෙන්න.

තද වැසි පවතින මාස් කන්නයේදී භූමි පිහිටීමේ පහල ප්‍රදේශයන්හි පසෙහි ජලය එක්රැස් වීමට ඉඩ තිබේ. මෙය වලකා ගැනීම සඳහා සුදුසු පරිදි ගැඹුරු කාණු සකසා වැඩි ජලය ඉවත් කළ යුතුය.

## ක්ෂුද්‍ර ජල සම්පාදන ක්‍රම

මිදි වගාව සඳහා බිංදු ජල සම්පාදනය (Drip Irrigation) හා විසිරුම් - විදුම් ජල සම්පාදනය (Spray Jet Irrigation) යන ක්ෂුද්‍ර ජලසම්පාදන ක්‍රම භාවිතා කළ හැකිය. දැනට බහුලව සිදුකරනු ලබන මතුපිට ජලසම්පාදන ක්‍රම හා සැසඳීමේදී ක්ෂුද්‍ර ජල සම්පාදන ක්‍රම අනුගමනය කිරීම මගින් ලබාගත හැකි ප්‍රධාන වාසි ගණනාවක් තිබේ.

- ක්ෂුද්‍ර ජල සම්පාදන ක්‍රම සඳහා අවශ්‍යවන්නේ මතුපිට ජල සම්පාදනය සඳහා අවශ්‍යවන ජල ප්‍රමාණයෙන් අඩක් පමණ වේ. මෙය විශාල ජල ඉතිරියකි.
- ලබාගත හැකි අස්වැන්න වැඩිකර ගත හැකිය.
- අස්වැන්න ලබාගැනීමේ කාලය වෙනස් කළහැකිය.
- ක්ෂුද්‍ර ජල සම්පාදන ක්‍රම මගින් මිදි වගාවේ කප්පාදු චක්‍රය වෙනස් කිරීමට හා අස්වැන්නේ ගුණාත්මය ඉහළ නැංවීම සඳහා ජලය හැසිරවීමේ රටාව වෙනස් කළ හැකිය.
- ජල සම්පාදන පද්ධතිය තුළින් රසායනික පොහොර හා කෘෂි රසායනික යෙදීමෙන් ඒ සඳහා වැය වන කම්කරු ශ්‍රමය 90% කින් පමණ ඉතිරිකර ගත හැකිය.
- ක්ෂුද්‍ර ජල සම්පාදන ක්‍රම මගින් කෙටි කාලාන්තරවලදී ශාකයේ ජල අවශ්‍යතාවය අනුව මුල මණ්ඩලයට පමණක් ජලය ලබාදේ. එමගින් පාංශු තෙතමනය ප්‍රශස්ථ මට්ටමකින් පවත්වාගත හැකිය. මෙය ශාකයේ වැඩීමට අතිශයින් වාසිදායක වන අතර, ශාකයේ කප්පාදුවට හා පුෂ්පීකරණයට අවශ්‍ය පරිදි තෙතමන තත්ත්වය පහසුවෙන් පාලනය කළ හැකිය.

## ක්ෂුද්‍ර ජලසම්පාදන ක්‍රම යෙදීමේදී සලකා බැලිය යුතු කරුණු

- ප්‍රදේශයේ වර්ෂාපතන රටාව
- මිදි වගා කර ඇති පස් වර්ගය හා ප්‍රදේශය අයත්වන කෘෂි දේශගුණික කලාපය අනුව බෝගයේ ජල අවශ්‍යතාවය
- ශාකයේ වර්ධක අවධිය, කප්පාදු කළයුතු අවස්ථාව හා පුෂ්ප හටගන්නා අවස්ථාව.
- ජලසම්පාදනය සඳහා භාවිතා කළයුතු ජලයේ ගුණාත්මය, මිදි වගාව සඳහා භාවිතා කළ යුත්තේ පළමු පංතියේ ජලය පමණකි. මෙම ජලයේ පී.එච්. අගය 6.1 - 7.3 අතරද විද්‍යුත් සන්නායකතාවය. මිටරයකට ඩෙසි සීමන් 0 - 0.8 අතරද පැවතිය යුතුය. මෙයට අමතරව මෙම ජලයේ අඩංගු වන ක්ලෝරයිඩ් (CI) අයන සාන්ද්‍රණය දස ලක්ෂයකට කොටස් 150 ට වඩා අඩුවිය යුතුය.

# යොදාගත හැකි විවිධ ක්ෂුද්‍ර ජලසම්පාදන ක්‍රම

## බිංදු ජල සැපයුම් ක්‍රමය

### දෙපේලි ජල සැපයුම් ක්‍රමය.

මිදි වැල් පේලිය දෙපසින් ජල විසර්ජක (ඩ්‍රිපර්ස්) සහිත පාර්ශ්වික නල යොද ඇත. මෙම පාර්ශ්වික නල දෙක අතර පරතරයට බෝගයේ වැඩීම අනුව වෙ:




එක් ශාක පේලියක් සඳහා පේලි 2ක් ලෙස ඩ්‍රිපර්ස් සහිත පාර්ශ්වික නල යෙදීම පාර්ශ්වික නල 2ක් අතර පරතරය හා ශාකයට ජලය පතිත වන ස්ථානය මිදි ශාකයේ වර්ධක අනුව වෙනස් වේ.

## තනි පේලි ජල සැපයුම් ක්‍රමය

එක් මිදි වැල් පේලියක් සඳහා ඩ්‍රිපර්ස් සහිත එක් පාර්ශ්වික නලයක් පමණක් යොදා තිබේ.




## ශාකයේ කවයකට ජලය ලබාදීම (කවාකාර බටයක් මගින්)



## ශාකයේ කවයකට ජලය ලබාදීම
## (කවයකට යෙදු ජලබිංදු විසර්ජක මගින්)




# විසුරුම්-විදුම් ජල සම්පාදන ක්‍රමය




මෙම විසුරුම් හිස මගින් ජලය ලබාදීමේදී ශාක කඳ හෝ පත්‍ර තෙමීමකට භාජනය නොවේ.

### වැදගත්

- මිදි වැලකට සැපයිය යුතු ජල ප්‍රමාණය දිනපතා හෝ පෙර තීරණය කරගත් කාල පරිච්ඡේදවලදී හෝ ලබාදිය හැකිය.
- කප්පාදු කිරීමට දින 5-7 පමණ පෙර ජල සැපයුම නවත්වන්න. ඉන්පසුව කප්පාදුකර දින 5-7 කට පසුව නැවත ජලය සපයන්න.
- අස්වැන්න නෙලීමට සති 2 පෙර සිට ශාකයට සැපයිය යුතු ජල ප්‍රමාණය ක්‍රමයෙන් අඩුකරන්න. මේ අන්දමට පසේ ඉතා අඩු තෙතමන ප්‍රමාණයක් පවත්වා ගනිමින් ජලය සැපයුම ක්‍රමයෙන් පාලනය කර ඉන්පසු ජලසැපයුම නවතා දැමිය යුතුවේ.

## ක්ෂුද්‍ර ජල සම්පාදන සමඟ පොහොර යෙදීම

(Micro Irrigation with Fertigation)

ක්ෂුද්‍ර ජලසම්පාදන ක්‍රම මගින් නිසි ප්‍රයෝජන ලබා ගැනීමට නම්, ජලසැපයුම් පද්ධතිය මගින් බෝගයට අවශ්‍ය පොහොර යෙදීමද ඉතා වැදගත්ය. මේ සඳහා ජලසැපයුම් පද්ධතියට පොහොර යෙදීමේ උපාංග කට්ටලයක් සවිකර ගත හැකිය. එසේ නැතහොත් වෙනත් අන්දමකට ජලසැපයුම් පද්ධතියට පොහොර එකතුකර බෝගයට ලබාදිය හැකිය. මේ අන්දමට යෙදිය යුත්තේ ජලයේ හොඳින් දියවෙන වගාවට ගැලපෙන රසායනික පොහොර වර්ග වේ. යූරියා, ඇමෝනියම් සල්ෆේට්, පොටෑසියම් නයිට්‍රේට්, මොනෝ ඇමෝනියම් පොස්පේට්, මොනෝ පොටෑසියම් පොස්පේට් වැනි අමිශ්‍ර රසායනික පොහොර හෝ ද්‍රාව්‍ය පොහොර භාවිතකර සාදගත් ද්‍රාව්‍ය පොහොර මිශ්‍රණයක් හෝ මේ අන්දමට ක්ෂුද්‍ර ජලසම්පාදන පද්ධතිය හරහා ලබාදිය හැකිය.

මෙහි සඳහන් කර ඇති ජලයේ ද්‍රාව්‍ය සමහර රසායනික පොහොර වර්ග ලබාගත නොහැකිනම් මූලික පොහොර ලෙස මියුරියේට් ඔෆ් පොටෑෂ් හා සාන්ද්‍ර සුපර් පොස්පේට් පසට යෙදිය හැකිය. යූරියා වැනි ද්‍රාව්‍ය පොහොර ක්ෂුද්‍ර ජලසම්පාදන පද්ධතිය තුළින් කෙටි කාලාන්තරවලදී සුළු ප්‍රමාණ වලින් වගාවට ලබාදිය හැකිය. මෙවිටද බෝගයේ වර්ධක අවධියත් හා කප්පාදු කිරීම වැනි ක්‍රියාවන් සමග පොහොර යෙදීම පාලනය කළ යුතුවේ.

## වල් පැළෑටි පාලනය

මිදි වැල වටා සෙන්ටි මීටර් 120 ක් (අඩි 4 ක්) පමණ ප්‍රදේශයක් උදළු ගා දමන්න. වැල් අතර ප්‍රදේශයේ පාලනය කිරීමට අපහසු කලාදුරු වැනි වල් පැළෑටි තිබේ නම් භූගත කොටස් සමග අතින් උදුරා ඉවත් කරන්න. නැතහොත් වැල්වලට නොවදින පරිදි "ග්ලයිපොසෙට්" වැනි වල් නාශකයක් යොදන්න.

මිදි පන්දලමක් තුල පාලනයකින් තොරව වල් පැළෑටි වැවීමට ඉඩ හැරීම නිසා වගාවට දිලීර රෝග වැලඳීමට ඇති හැකියාව වැඩිවේ. කෙසේ වුවද මිදි වැල් හොඳින් වර්ධනයවී ඇති පන්දලමක එතරම් කරදරකාරි මට්ටමකින් වල් පැළෑටි හට නොගනී.

## පොහොර යෙදීම

මිදි වගාවෙන් සාර්ථක ප්‍රතිඵල ලබා ගැනීම සඳහා කාබනික පොහොර හා රසායනික පොහොර යන දෙවර්ගයම මැනවින් යෙදිය යුතුය. විශේෂයෙන් මිදි වගාව සඳහා විශාල වශයෙන් කාබනික පොහොර යෙදීම අනිවාර්යෙන්ම සිදු කළ යුත්තකි.

## කාබනික පොහොර

පැල සිටු විමට පෙර හොඳින් දිරා පත්වූ ගොම, කොළ පොහොර ආදිය යොද වලවල් පුරවන්න. යම් හෙයකින් ඉහතින් සඳහන් කර ඇති පරිදි වැල වටා කාණු කැපීම කල නොහැකි විට රසායනික පොහොර යෙදීමට පෙර, වැල් වටා කාබනික පොහොර විසුරුවා හැර පසට මුල්ලු කරන්න. මෙවැනි සෑම අවස්ථාවකදීම එක් වලකට දිරාපත්වූ ගොම හෝ වෙනත් කාබනික පොහොර වර්ගයකින් 'පොලිසැක්' මළු දෙකක් වත් අනිවාර්යෙන්ම යොදන්න.

කප්පාදු කරනු ලබන සෑම අවස්ථාවකටම පසුව වැලෙහි සිට මීටරයක් පමණ දුරකින් සෙන්ටි මිටර් 30 පමණ පළල ප්‍රදේශයක සෙන්ටි මිටර් 20-25 (අඟල් 8-9) පමණ ගැඹුරකට පස් ඉවත් කරන්න. මෙය තුලට කාබනික හා රසායනික පොහොර යොද පස් වලින් වසන්න. වැල වටා මෙලෙස නොගැඹුරු ලෙස පස් ඉවත් කිරීමේදී මතු පිට ප්‍රදේශයේ ඇති මුල් කැපී, කිරි මුල් හට ගනී. එනිසා යොදන පොහොර වලින් වැඩි ප්‍රමාණයක් බෝගයට ලබා ගැනීමට ඉඩ සැලසේ.

## රසායනික පොහොර

මිදි වගාවට නිර්දේශිත පරිදි යෙදිය යුතු රසායනික පොහොර වර්ග අමිශ්‍ර පොහොර ලෙස ලබාගෙන මිශ්‍ර කරගන්න. නිර්දේශිත ආකාරයට මිදි වගාවට යෙදිය යුතු රසායනික පොහොර වලින් කිලෝ ග්‍රෑම් 50 ක් සකස් කර ගැනිම සඳහා යූරියා කිලෝ ග්‍රෑම් 13 ක් සාන්ද්‍ර සුපර් පොස්පේට් කිලෝ ග්‍රෑම් 09 ක් සහ මියුරියේට් ඔෆ් පොටෑෂ් කිලෝ ග්‍රෑම් 28 ක් අවශ්‍යවේ. මෙම පොහොර ප්‍රමාණය එකිනෙක සමග හොඳින් මිශ්‍ර කර වගාවට යොදන්න. පැල සිටුවීම සඳහා සකස් කර ගත් වලකට මෙම පොහොර මිශ්‍රණයෙන් ග්‍රෑම් 450 ක් යොද පස් සමග කලවම් කරන්න.

පැල සිටුවා මාස 4 ක් ගත වූ පසු ඉහත මිශ්‍රණයෙන් නැවත වරක් ග්‍රෑම් 450 ක් වැලකට යොදන්න.

පළමු කප්පාදුවට පසුව එක් වැලකට පොහොර ග්‍රෑම් 900 බැගින් යොදන්න. ඉන් පසු සෑම කප්පාදුවකටම පසුව එක් වැලකට යෙදිය යුතු පොහොර ප්‍රමාණය ග්‍රෑම් 225 බැගින් වැඩි කරන්න. මේ අන්දමට වැලකට වසරකදී යොදනු ලබන පොහොර ප්‍රමාණය ග්‍රෑම් 2700 ක් දක්වා වැඩි කරන්න. වසරකදී වැලකට යෙදිය යුතු පොහොර ප්‍රමාණයෙන් අඩක් බැගින් කප්පාදුවට පසුව යොදන්න.

වැල් කප්පාදු කර දින 5-6 කට පසුව රසායනික පොහොර හා කාබනික පොහොර යොද ජලය සපයන්න.

## අස්වැන්න නෙලීම

මිදි වැල් කප්පාදු කර අස්වැන්න නෙලීමට ගත වන කාලය ප්‍රභේද අනුව වෙනස් වේ. සාමාන්‍යයෙන් මේ සඳහා මාස 3- 3 1/2 පමණ කාලයක් ගතවේ. නෙලා ගත යුත්තේ හොඳින් ඉදී ඇති මිදි පොකුරු පමණකි. නෙලා ගැනීමෙන් පසුව ගෙඩි වල ඉදීමක් සිදු නොවේ. නෙලන අවස්ථාවේදී, වගා කර ඇති ප්‍රභේදයට අනුකූල වර්ණය ගෙඩිවල පැවතිය යුතුය. කොළ පැහැති ගෙඩි හට ගන්නා වර්ගවල අස්වැන්න නෙලීමට සුදුසු අවස්ථාවේදී ගෙඩිවල පැහැය ලා කහ-කොළ හෝ විනිවිද පෙනෙන ස්වභාවයක් ගනී.

මිදි පොකුරක ගෙඩි ඉදීම සිදු වන්නේ ඉහළ සිට පහළටය. එනිසා පොකුරේ පහළින්ම ඇති ගෙඩි හොඳින් පැණි රස වූ අවස්ථාවේදී අස්වැන්න නෙලා ගන්න.

අස්වැන්න නෙලන අවස්ථාවේදී හා වෙළඳපොලට සුදනම් කිරීමේදී මිදි ගෙඩි වටා දැකිය හැකි අළු පටලය ඉවත් නොවීමට වග බලා ගන්න. මෙම අළු පටලය ගෙඩියෙන් ජලය ඉවත් වී වියළී යාම වලකාලයි.

මිදි පොකුරු වැලට සම්බන්ධ වී ඇති නටුවෙන් කපා ඉවත් කර ගන්න. ඉන් පසු පෙට්ටිවල ප්‍රවේශමෙන් අසුරා වෙළඳපොළට ඉදිරිපත් කළ හැකිය.

# අස්වැන්න

මිදි වැලකින් ලබා ගත හැකි අස්වැන්න වැල් පුහුණු කරනු ලබන ක්‍රමය හා වගා කර ඇති ප්‍රභේදය, පාලන ක්‍රම ආදිය අනුව වෙනස් වේ. මැනවින් රැක බලා ගත් විට හා හිතකර කාලගුණික තත්ව පවතින විට විවිධ වැල් පුහුණු කිරීමේ ක්‍රම යටතේ පවත්වා ගත් වගාවන්හි එක් වැලකින් ලබා ගත හැකි අස්වැන්න පහත දක්වා තිබේ.

## මැසි ක්‍රමය

සිටුවා වසරකට පමණ (මාස 14 කට) පසුව එක් වැලකින්

| | |
|---|---|
| පළමු අස්වැන්න | - කි. ග්‍රෑ. 05 |
| දෙවන අස්වැන්න වසර 1-1 1/2 | - කි. ග්‍රෑ. 10 |
| තුන්වන අස්වැන්න වසර 02 | - කි. ග්‍රෑ. 15 |
| හතරවන අස්වැන්න වසර 2 1/2 | - කි. ග්‍රෑ. 20 |
| පස් වන අස්වැන්න වසර 3කදී | - කි. ග්‍රෑ. 25 |

## වැට ක්‍රමය

සිටුවා වසරකට පසුව එක් වැලකින්

| | |
|---|---|
| පළමු අස්වැන්න | - කි. ග්‍රෑ. 02 |
| වසර 1 1/2 දී | - කි. ග්‍රෑ. 04 |
| වසර 3 කදී | - කි. ග්‍රෑ. 08 |

# රෝග පාලනය

## යටි පුස් රෝගය
(Downy Mildew)

මිදි වගාවට වැලදිය හැකි ඉතාම දරුණු රෝගය මෙයයි. තෙත් කලාපයේ සාර්ථකව මිදි වගා කිරීම අපහසුවීමට එක් ප්‍රධාන හේතුවක් වන්නේද මෙම රෝගයයි.

මෙම රෝගය ඇති වන්නේ (ප්ලාස්මොපෝරා විටිකෝලා) නැමති දිලීරය මගිනි. පත්‍රයේ යටි පැත්තේ පැල්ලම් ලෙස සුදු පැහැති දිලීර ජාල දැක ගත හැකිය.



මෙම පැල්ලම් සහිත ස්ථාන වල පත්‍රය මතු පිට කහ පැහැති පැල්ලම් ඇතිවේ. මෙවැනි පැල්ලම් ක්‍රමයෙන් වියළී පසුව මුළු පත්‍රයම වියළී යයි. රෝගය දරුණු තත්වයට පත්වූ විට පත්‍ර වැටේ.

මෙම රෝග කාරක දිලීරය මිදි පොකුරුවලට සහ මල් වලටද හානි කරයි. මෙහි ප්‍රථිඵලයක් වශයෙන් මල් පොකුරු වියළී යයි. හානි වූ ගෙඩි ඇතුලතට ගිලා බැස හැකිලි ගිය ආකාරයක් ගනී.

වර්ෂාව සහිත තෙත් කාළගුණික තත්වයක් පවතින අවස්ථාවලදී මෙම රෝගය වැඩි වශයෙන්ම වගාවට වැලඳේ. එසේම යටි පුස් රෝගය නිසා විශාල අස්වනු හානියක් ඇතිවේ.

මෙම රෝගය යල කන්නයට වඩා මාස් කන්නයේදී වැඩි වශයෙන් දක්නට ලැබේ. කප්පාදුවෙන් පසුව හටගන්නා අළුත් දළු හා කුඩා මල් පොකුරු මෙම රෝගයට පහසුවෙන් ගොදුරු වේ. මෙම අවස්ථාවේදී මෙම රෝගය පිළිබඳව විශේෂයෙන් පරීක්ෂාකාරීවී වහාම නිර්දේශිත දිලීර නාශකයක් යෙදීම වැදගත්ය.
මෙම රෝගය පාලනය කර ගැනිම සඳහා පළමුවෙන්ම කළ යුත්තේ දරුණු ලෙස රෝගය වැළඳී ඇති පත්‍ර හා වෙනත් ශාක කොටස් වගාවෙන් ඉවත් කර ගිනි තබන්න. ඉන් පසු පහත සඳහන් දිලීර නාශකයක් වැලට යොදන්න.

මැන්කොසෙබ් 80% ජලයේ දිය කළ හැකි කුඩු ග්‍රෑ. 20 ක් ජලය ලීටර් 10 ක

**හෝ**

ප්‍රොපිනෙබ් 70% ජලයේ දිය කළ හැකි කුඩු ග්‍රෑ. 20ක් ජලය ලීටර් 10 ක

**හෝ**

මෙටැලැක්සිල් 8% සහ මැන්කොසෙබ් 64% අඩංගු තෙත් කළ හැකි කුඩු ග්‍රෑ. 20 ක් ජලය ලීටර් 10 ක දිය කර,

එම දිලීර නාශකය දින 6-10 අතර කාලාන්තරයකින් පත්‍රවල යටි පැත්තට හොඳින් වදිනසේ යොදන්න.

මෙයට අමතරව බෝඩෝ මිශ්‍රණය යෙදීම මගින්ද මෙම රෝගය සාර්ථකව පාලනය කරගත හැකිය.

# පිටිපුස් රෝගය
(Powdery Mildew)



පිටිපුස් රෝගය වැලදෙන්නේ (අන්සිනියුලා නෙකටෝර්) නම් දිලීරය නිසාය. මෙම රෝගය නිසා පළමුවෙන් මේරූ හා ළපටි පත්‍ර දෙපැත්තේම පිටි වැනි ස්වභාවයක් ගන්නා සුදු අළු පැහැති පැල්ලම් හටගනී. මල් පොකුරු හා ලපටි ගෙඩිවලටද නොමේරූ කොළ පැහැති රිකිලි හා දඬුවලටද දිලීරය නිසා හානි ඇති විය හැකිය. ටික කලක් ගතවූ පසු මෙම අළු සුදු පැහැති පැල්ලම් ලෙස දිස්වෙන දිලීර කොටස් කළුපැහැ ගැන්වේ. වර්ෂාව අඩු වියළි කාලගුණික තත්වයක් යටතේ මෙම රෝගය බහුලව දැකිය හැකිය. රෝගය වැලදුනු ලපටි ගෙඩි තද ස්වභාවයක් ගැනීම හා පැලීම සිදුවිය හැකිය. රෝගී ගෙඩිවල ඉදීම සාමාන්‍ය පරිදි සිදු නොවේ.

රෝගය පාලනය කර ගැනීම සඳහා පහත සඳහන් දිලීර නාශක දින 10කට වරක් බැගින් වැලට යොදන්න.

බිටටනෝල් 300 g/EC සාන්ද්‍ර තෛලෝදයෙන් මිලි මීටර් 10 ක් වතුර ලීටර් 10 ක දියකර

**හෝ**

ක්ලෝරෝතැලොනිල් 75% ක් තෙත්කළ හැකි කුඩු ග්‍රෑම් 20 ක් වතුර ලීටර් 10

# මිදි ගෙඩි කුණු වී යාම
(Grape Ripe Rot)

මෙය "ග්ලොමරෙල්ලා" විශේෂයට අයත් (Glomarella Spp) දිලීරයකින් ඇතිවේ. මෙම රෝගය නිසා ගෙඩිවල උඩට මතු වූ දුඹුරුපාට කුඩා තිත් හට ගනී. තෙත් කාළගුණයක් ඇති විට රෝගය වඩාත් උග්‍රවේ. රෝගය වැළඳුන ගෙඩි, හැකිලී වියළී (Mummified Fruits) රැලි වැටී කුණුවී යයි. පොකුරක ගෙඩි කිහිපයක් වුවද මෙම රෝගයට පාත්‍ර විය හැකිය. බොහෝ විට මුළු පොකුරම වියළී කුණුවීමකට ලක්වේ.

මේ සඳහා දින 7-10 වරක් බැගින් පහත සඳහන් දිලීර නාශක වැලට යොදන්න.

ක්ලෝරෝතැලොනිල් 75% තෙත් කල හැකි කුඩු ග්‍රෑම් 20 ජලය ලීටර් 10

**හෝ**

මැන්කොසෙබ් 80%තෙත් කල හැකි කුඩු ග්‍රෑම් 20ක් වතුර ලීටර් 10

# කෘමි හා වෙනත් පලිබෝධ

පත්‍ර වලට හානි කරන දළඹු වර්ග බොහෝ විට ලපටි පත්‍ර ආහාරයට ගනී. ඉතා දරුණු හානියක් නොපවතී නම් දළඹුවන් අතින් අහුලා විනාශ කළ හැකිය.

## කොරපොතු කෘමීන්

මිදි වැලෙහි විවිධ කොටස් වලින් යුෂ උරාබොයි. මොවුන්ගේ අපද්‍රව්‍යවල අඩංගු සීනි සහිත සංයෝග වෙත කුහුඹුවන් ආකර්ශණය වේ. එසේම මෙම සීනි අඩංගු සංයෝගය මත කළු පැහැති දිලීරයක් වර්ධනය වේ. මෙම කළු පැහැය නිසා පත්‍රවල ආහාර නිපදවීමට ඇති හැකියාව අඩුවේ. ගෙඩිවල ගුණාත්මය පහළ වැටේ.

මෙම හානිය පාලනය කර ගැනිම සඳහා
ඩයිම්තොඑට් 40% සාන්ද්‍ර තෛලෝදය

**හෝ**

ඔක්සිඩෙමටොන් මීතයිල් 25%
සාන්ද්‍ර තෛලෝදය මිලි ලිටර් 2- 4
වතුර ලිටර් 01 ක දියකර පත්‍ර හා කඳ කොටස් වල යටි පැත්තට ද වදිනසේ ඉසින්න.
මර්ධනය සඳහා රසායනික නොවන ක්‍රම හඳුනාගෙන නොමැත.

## කැප්සිඩ් මකුණා

කප්පාදුවෙන් පසු ඇතිවන අළුත් රිකිලිවල පහළ ප්‍රදේශය සිදුරු කර යුෂ උරාබොයි. යුෂ උරාබීම නිසා වැලට ඇතුල් වන විෂ සහිත සංයෝග හේතුවෙන් හානි කළ රිකිලි කුරුවේ. සුළඟට කඩා වැටේ. දරුණු හානියක් පවතින වගාවන්හි විශාල වශයෙන් අස්වැන්න අඩුවේ.

මෙම හානිය පාලනය කිරීම සඳහා
කප්පාදුවෙන් පසු

**හෝ**

ලපටි රිකිළි හටගන්නා අවස්ථාවේදී

**හෝ**

කාබරිල් 85% ජලයේ දියකළ හැකි
කුඩු ග්‍රෑම් 06 ක් වතුර ලිටර් 10 ක දියකර

**හෝ**

කාබෝසල්ෆාන් ලීටරයකට ග්‍රෑම් 200
සාන්ද්‍ර තෛලෝදය මිලි ලිටර් 30
වතුර ලිටර් 10 ක දියකර හොඳින් ඉසින්න.
හානියේ ස්වභාවය අනුව යෙදිය යුතු වාර ගණන තිරණයවේ.. කෙසේ වුවද නිෂ්පාදිතයේ නිර්දේශයන් පිළිපැදිම වැදගත් වේ.

## වේයා

වගාව ආරම්භයේ සිටම මෙය ගැටළුවක් වීමට ඉඩ තිබේ. ලපටි වැල් වැඩීම සඳහා ඒ අසලින් සිටුවන පැල නොවන ලී කෝටු වෙත පළමුවෙන්ම වේයන් ආකර්ශනයවේ. ඉන්පසු ක්‍රමයෙන් මිදි වැලේ මුල්, කඳෙහි පිටපොත්ත ආදිය ආහාරයට ගැනිම නිසා වැල මැරී යයි.

මෙම හානිය පාලනය කිරීම සඳහා පහත ක්‍රියා මාර්ග අනුගමනය කරන්න.

- ලපටි වැල් සඳහා ආධාරක ලෙස වේයන්ගෙන් හානියට ගොදුරු නොවන ලී වර්ගයක (කෙහොඹ වැනි) කෝටු සිටුවන්න.

- කෝටුවක පසට යටවන ප්‍රදේශය පිළිස්සුන එන්ජින් තෙල්වල ගිල්වා පොලිතින් කැබැල්ලක් ආවරණය කරන්න.
- මිදි වගාවට විශාල වශයෙන් යොදන කාබනික පොහොර වෙත වේයන්ගේ ආකර්ශණය වැඩිය. එනිසා හොඳින් දිරාපත්වූ ගොම පොහොර පමණක් වගාවට යොදන්න.
- වගාව පිළිබඳව නිරතුරුව පරීක්ෂාකාරී වන්න. වේයන්ගේ හානිය හානිය ඇති බව දක්නට ලැබු විට ක්ලෝරොෆයිරිපොස් හෝ ඇඩ්මයර් කෘමිනාශක මල් බාල්දියකින් වැල වටා යොදන්න. වැල් කුඩා කළ මෙය විශේෂයෙන් වැදගත්ය.

# වැල් සිදුරු කරන කෘමීන්

මේරූ කඳ සිදුරු කිරීම නිසා හානි කළ ස්ථාන වලින් මැලියම් වැනි අවර්ණ දීලිසෙන සුළු ද්‍රව්‍යයන් වැස්සේ. උදය වරුවේ මෙය වඩා පැහැදිලිය. වැසි කාලයේදී මෙම ශ්‍රාවය වන ද්‍රව්‍ය සොයා ගැනීම අපහසුය. කඳට හානි කළ ස්ථානයට ඉහළින් වැලේ වැඩීම දුර්වලවේ. හානිය දක්නට ලැබෙන විට වැල වටා කාබෝෆියුරාන් ග්‍රෑම් 50 බැගින් පසට යොද ජලය සපයන්න.

# පැල මැක්කා

හානි වූ පත්‍ර ඉහළට හැකිලේ. එවැනි පත්‍ර දුඹුරු පැහැවේ. මල් හා ගෙඩිවලට ද හානි ඇතිවිය හැකිය. හානි වූ ලපටි ගෙඩි සුදු පැහැයකට හැරේ. හානි කළ මේරූ ගෙඩිවල පිට පොත්ත රළු වේ.

# කුරුල්ලෝ

මිදි පොකුරුවලට හානි කරන කුරුල්ලන්ගෙන් වගාව ආරක්ෂාකර ගැනීම සඳහා පරණ මාළු දැල් වලින් වගාව ආවරණය කරන්න. නැතහොත් පහත කෙළවර විවෘතව පවතින පොලිතින් උර වලින් මිදි පොකුරු ආවරණය කරන්න.

# දෙබරු

ඊශ්‍රායල් බිලු වැනි, ඉදීමට දිගු කාලයක් ගතවන වර්ග වල ගෙඩි වල යුෂ උරාබොයි.

# මිදි ගෙඩි පැලීම

අස්වැන්න නෙලීමට ආසන්න අවස්ථාවේදී මිදි වැලට ජලය සැපයීම නිසාද වර්ෂාව නිසා ද මිදි ගෙඩි පැලියා හැකිය. එනිසා අස්වැන්න නෙලීමට දින 10 කට පමණ පෙර සිට වගාවට ජලය සැපයීම නවත්වන්න. වර්ෂාව නිසා පසේ එක්රැස්වන වැඩි ජලය ගැඹුරු කානු යෙද ඉවත් කරන්න.

පන්දලමට සෙන්ටි මීටර් 60 (අඩි 2) පමණ ඉහලින් ආරුක්කුවක ආකාරයට සැකිල්ලක් සකස් කර එය මත විනිවිද පෙනෙන පොලිතිනයක් ඇතිරීමෙන් මිදි වැල වර්ෂාවෙන් ආරක්ෂාකර ගත හැකිය. මෙය වඩා වැදගත් වන්නේ මාර්තු - අප්‍රේල් මාසවලදී වියළි කලාපයට බෝහෝවිට ලැබිය හැකි වර්ෂාවෙන් ඉදුණු ගෙඩි ආරක්ෂා කර ගැනීම සඳහාය.

## වර්ග මීටර් 1000 ක (අක්කර 1/4) මිදි වගාවක් පන්දලම් ක්‍රමයට පිහිටුවා ගැනීම

මිදි වගාව පිළිබඳව පළපුරුද්දක් නැති අයකුහට ඉතා අධික මූලික වියදමක් දරා විශාල ප්‍රමාණයෙන් වගාවක් ආරම්භ කිරීම එතරම් නුවණට හුරු නොවේ. එනිසා වර්ග මීටර් 1000 (අක්කර 1/4) පමණ ප්‍රමාණයේ මිදි වගාවක් ආරම්භයක් වශයෙන් ඇති කිරීම වඩා සුදුසුය.

ඉඩම සමචතුරශ්‍රාකාර හැඩයකින් යුක්ත නම් සහ පැළ පේලි වැඩි සංඛ්‍යාවක් ඇති වන පරිදි වගාව සකස් කරගත හැකිනම් එය වඩා ලාභදායකය. ඉඩමේ හැඩය අනුව අවශ්‍ය ද්‍රව්‍ය වෙනස්වේ. සාමාන්‍යයෙන් මේ ප්‍රමානයේ මිදි වගාවක් පන්දලම් ක්‍රමයට සකසා ගැනීම සඳහා පහත සඳහන් ද්‍රව්‍ය අවශ්‍ය වේ.

අඩි 8 උස කොන්ක්‍රීට් කණු 80 - 90

මෙම කොන්ක්‍රීට් කණුවල පාදය අඟල් 6× 6 ප්‍රමාණය ද ඉහළ කෙළවර අඟල් 4×4 ප්‍රමාණයද තිබිය යුතුය.

කොන්ක්‍රීට් කණු වෙනුවට අඟල් 1 1/2 ප්‍රමාණයේ ජී.අයි. බට යොදගන්නේ නම් සම්මත දිගින් යුත් බට 40 අවශ්‍යවේ.

ගේජ් 8 හෝ ගේජ් 10 ප්‍රමාණයේ ජී.අයි. කම්බි - කි. ග්‍රෑ. 90

ගේජ් 12 ප්‍රමාණයේ ජී.අයි. කම්බි - කි. ග්‍රෑ. 250

අඟල් 1 × 2 එල් හැඩති යකඩ දඬු - 16

සිමෙන්ති - කි. ග්‍රෑ. 75-100

වැලි සහ ගල් අවශ්‍ය පමණට

| ශ්‍රම අවශ්‍යතාව | | මිනිස් දින |
|---|---|---|
| වලවල් කැපීම | - | 10 |
| වලවල් පිරවීම | - | 08 |
| පැල සිටුවීම | - | 02 |
| කණු සිටුවීම | - | 15 |
| කම්බි ඇදීම | - | 20 |